පළමුවන කලාපය | 1st Edition

RAHULAYA

# රාහුලය 2020

රාහුල විද්‍යාලයීය නිල වාර්ෂික සඟරාව | Annual official magazine of Rahula College



1923 -2023
RAHULA
DIGNITY OF THE CENTURY

2020/21 ජ්‍යේෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලයේ ව්‍යාපෘතියකි



සියවසක අභිමානය සමරන්නට සූදානම් වන රහල් මාතාවගේ 98 වන ජන්ම දිනය නිමිත්තෙන් ඇයගේ 2020/21 ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක පුතුන් විසින් ඇය වෙත පිදෙන තිළිණයකි.

Mother Rahula is awaiting to celebrate her century of excellence. En route to such a milestone, this is a small token of gratitude by her senior prefects of 2020/21 with respect to 98 years of priceless service.

ව්‍යාපෘතිය සඳහා අනුග්‍රහය රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය



රාහුලය 2020

# අන්තර්ගතය..


04 සංස්කාරකගෙන්
05 අභිෂේක 2020
08 නිවාසාන්තර ක්‍රීඩා උළෙල 2020
10 තවමත් ශරීරයෙන් විකිරණ පිටකරන මාරි කියුරි
12 5S පංචවිධ සංකල්පය
13 රාහුල බාලදක්ෂයින්ගේ 69 වන සංවත්සරය
14 So close but yet so far
16 මොන දේ කරත් ඒක හරියට කරන්න විදුහල්පතිතුමන්ගේ සම්මුඛ සාකච්ඡාව
18 මතකයන්
20 හෙට ලොවට රාහුලෙන් නායකයෙක්
22 ආස නැද්ද එක දවසකට හරි සිංහයෙක් වෙන්න
24 වසරේ විශිෂ්ටතම ශිෂ්‍යයා - 2018
26 රාහුල පා ගමන - 2020
28 නැවතුන බිග් මැච්
30 හතරසිංහ ගුරුතුමියගේ සම්මුඛ සාකච්ඡාව
32 සොබාදහම වෙනුවෙන් කාලය
34 Alleviating poverty in Sri Lanka through higher education
36 ඉසිවරාභිෂේක 2020
38 අනාගත රාහුලය
40 සිනහා කඳුලු එනවා යනවා
41 සෙනෙහසේ අරුණැල්ල 2020
42 සිසු නයු අභිසෙස්
44 රාහුල ගුරු සිසු නිර්මාණ
50 සුපසන් රාහුලයක් උදෙසා කාර්යක්ෂම ගුරුභවතෙක්
51 ස්වර්ණ සිංහ සංග්‍රාමයට එසවුණු ප්‍රථම ධජය
52 ජීවිතයට වගකියන්න
54 රාහුලයෙන් බිහිවූ ප්‍රථම ජනාධිපති පරිසර නියමුවන්

## සංස්කාරකගෙන්.....


වසර ගණනාවකට පසුව රාහුල විද්‍යාලයේ වාර්ෂික සඟරාවක් පාඨක ඔබ වෙතට මෙලෙස ඉදිරිපත් කිරීමට හැකිවීම සම්බන්ධයෙන් මෙම සඟරාවේ සංස්කාරකවරුන් ලෙස අපට ඇත්තේ ඉතා නිහතමානී ආඩම්බරයකි. ඉතා දීර්ඝ කාලයකට පසුව රාහුල විද්‍යාලයේ 2020/21 ශිෂ්‍ය නායක මණ්ඩලයේ මූලිකත්වයෙන් නැවත ලියවුනු "රාහුලය" අභියෝගාත්මක 2020 වසර තුල රාහුල විද්‍යාලය පැමිණි ගමන් මගේ සියලු තතු ඔබ වෙත ඉදිරිපත් කරන අතරම තවත් රාහුලයේ මෙන්ම වෙනත් තතු බොහොමයක්ද මෙහි අන්තර්ගත වේ. සාමාන්‍ය සඟරාවක් ලෙසින් පාඨක ඔබ වෙතට මෙම සඟරාව සමීප කරන්නට අප උත්සාහ කළද විටින් විට පැන නැගුනු යම් යම් ගැටලුකාරී තත්ත්වයන් හමුවේ අවසානයේ මෙය e-සඟරාවක් ලෙසින් ඔබට තිළිණ කරන්නට අප තීරණය කළෙමු. කෙසේ නමුත් ඉදිරි වසර වල සිට e-සඟරාවක් ලෙසත් සාමාන්‍ය සඟරාවක් ලෙසත් මෙය ඔබ වෙත සමීප වනු ඇත. කෙසේ හෝ රාහුල විද්‍යාලයට දීර්ඝ කාලයක සිට අඩුවක්ව පැවැති මෙම වාර්ෂික සඟරාව නව ව්‍යාපෘතියක් ලෙස නැවත් දියත් කිරීමට හැකිවීම අප ලද ජයග්‍රහණයකි. මෙම සඟරා ව්‍යාපෘතිය සඳහා නන් අයුරින් අපට සහය දැක්වූ විද්‍යාලයේ විදුහල්පතිතුමන් ඇතුලු සියලු දෙනාටත් අප කල ඉල්ලීම් වලට අනුව ලිපි ලබා දුන් සියලු දෙනාටත් ව්‍යාපෘතිය සඳහා අනුග්‍රාහකත්වය ලබාදුන් විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයටත් අපගේ කෘතවේදීත්වය පුද කර සිටින්නෙමු. දීර්ඝ කාලයකට පසුව පාඨක ඔබට නව අත්දැකීමක් ලෙසින් තිළිණ කරන මෙම "රාහුලය" සඟරාව රසවිඳින ලෙස අප ඉල්ලා සිටිමු.

ස්තුතියි!

ජ්‍යේෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලය
2020/21

## නභෝගත විද්‍යාලයීය ධජය අභිමුඛයේ සිට දිවුරා ප්‍රතිඥා දෙමි

# අභිෂේක 2020




රාහුලය මහා වෘක්ෂයක් නම් එහි අරටුව ලෙස සැලකෙන්නේ රාහුල විද්‍යාලයීය ශිෂ්‍ය නායක මණ්ඩලයයි. සෑම වසරකම මුල් භාගයේදී විද්‍යාලය විසින් එම වසර සඳහා ශිෂ්‍ය නායක මණ්ඩලය තෝරා පත් කරගනු ලබන අතර "අභිෂේක" ශිෂ්‍ය නායක මණ්ඩලය දිවුරුම් දීමේ උත්සවයේදී ඔවුන් ශිෂ්‍ය නායකයින් ලෙස නිල වශයෙන් දිවුරුම් දෙනු ලබයි. එලෙස රාහුල විද්‍යාලයේ 2020/21 වර්ෂයන් සඳහා තොරා පත් කර ගනු ලැබූ ශිෂ්‍ය නායක මණ්ඩලය "අභිෂේක 2020" දිවුරුම් දීමේ උත්සවයේදී ඉතා අභිමානවත් අයුරින් දිවුරුම් දෙනු ලැබීය. 2020/21 වර්ෂ සඳහා ප්‍රධාන ශිෂ්‍ය නායක ලෙස හවිඳු රන්දෙව් මාරසිංහ සිසුවා දිවුරුම් දුන් අතර ප්‍රධාන විධායක සංවිධායක හා උප ප්‍රධාන ශිෂ්‍ය නායක ලෙස ඉසුරු ගලප්පත්ති සිසුවා දිවුරුම් දෙන ලදී. එමෙන්ම උප ප්‍රධාන ශිෂ්‍ය නායකයින් ලෙස සශ්මික පසන් බටගොඩ හා විහඟ කාශ්‍යප යන සිසුන් දිවුරුම් ලබා දුන් අතර 42 දෙනෙකුගෙන් සමන්විත ජ්‍යේෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලයක්ද අභිෂේක ගැන්වුණි. ශිෂ්‍ය නායකයින්, උප ශිෂ්‍ය නායකයින් හා ආධුනික ශිෂ්‍ය නායකයින් ඇතුලත්ව සමස්ත ශිෂ්‍ය නායකයින් 195 දෙනෙකු අභිෂේක 2020 උළෙලේදී අභිෂේක ලැබීය. මෙම උත්සවයේ ප්‍රධාන අරාධිත අමුත්තා වශයෙන් රාහුල විද්‍යාලයේ කීර්තිමත් ආදි ශිෂ්‍ය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ බ්‍රිගේඩියර් චන්දන සෝමවීර මහතා සහභාගී වූ අතර සෙසු ආරාධිත පාසල් වල ශිෂ්‍ය නායකයින්, ගුරුවරුන්, දෙමාපියන් ඇතුලු අනෙකුත් සම්භාවනීය ආරාධිතයින් විශාල සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් ඉතා අභිමානවත් අයුරින් මෙම උත්සවය පැවැත්වුණි.


2020
RAHULA COLLEGE MATARA

# නිවාසාන්තර ක්‍රීඩා උළෙල - 2020

රාහුලයෝ සැබවින්ම ක්‍රීඩාවෙහි දක්ෂයෝය. රාහුලයෙන් ජාතික තලයට දායාද කළ ඉතාමත් දක්ෂ ක්‍රීඩකයන් රැසකි. ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කළ සුරාජ් රන්දිව්, ප්‍රමෝද්‍ය වික්‍රමසිංහ වැනි ක්‍රීඩකයන් ඊට උදාහරණ වේ. ක්‍රිකට් පමණක් නොව පිහිනුම් මලල ක්‍රීඩා වැනි අනෙකුත් බොහෝ ක්‍රීඩා ඉසව් වලින් රාහුලයෙන් බිහිවූ දක්ෂයින් බොහෝ ජාතික අන්තර්ජාතික මට්ටමේ ජයග්‍රහණ රාහුලයට දිනා දී ඇත. එවැනි දක්ෂ ක්‍රීඩකයින් බිහිවන ප්‍රධානතම අවස්ථාවක් ලෙස විද්‍යාලයීය වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උළෙල වැදගත් වේ" පුරා මාස දෙකක පමණ කාලයක් තුල විජය, ගැමුණු, ප්‍රරාක්‍රම, අශෝක යන සිව් නිවාසයන්ට බෙදී රාහුලයෝ තම නිවාසය ජයග්‍රහණය කරා ගෙන යාමට නොයෙකුත් ක්‍රීඩා ඉසව් වලින් තරඟ කරති. මළල ක්‍රීඩා, පිහිනුම්, පැසිපන්දු, පාපන්දු, හොකී, චෙස්, ක්‍රිකට්, මුහුදු පිහිණුම්, කරාතෙ, ජිම්නාස්ටික් ආදී විවිධ ක්‍රීඩා ඉසව් වලින් තරඟ කරමින් රාහුලයෝ ලකුණු පුවරුවේ තම නිවාසයේ ස්ථානය තහවුරු කරගැනීමට ඉතාමත් උද්යෝගයෙන් කටයුතු කරති. මෙවර රාහුල විද්‍යාලයේ නිවාසාන්තර ක්‍රීඩා උළෙලේ සමාප්ති උත්සවය පෙබරවාරි මස 07 වන දින  රාහුල විද්‍යාලයේ කීර්තිමත් ආදි ශිෂ්‍ය කඹුරුපිටිය මහ රෝහලේ කායික රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය ජයන්ත විජේරූප මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ රාහුල විද්‍යාලයේ කීර්තිමත් ආදි ශිෂ්‍ය වලස්මුල්ල මූලික රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය රංග චන්ද්‍රසේන මැතිතුමාගේ සම්භාවනීය සහභාගීත්වයෙන් ඉතා උත්කර්ෂවත් අයුරින් පැවැත්විණී. සියලු ක්‍රීඩා ඉසව් අවසානයේ විජය නිවාසය ලකුණු පුවරුවේ ඉහළින්ම සිටිමින් නිවාසාන්තර ක්‍රීඩා උළෙලේ සමස්ත ශූරතාවය දිනාගත් අතර අනුශූරතාවය දිනාගනු ලැබුවේ අශෝක නිවාසයයි. පිළිවෙලින් පරාක්‍රම හා ගැමුණු නිවාස තුන්වන සහ හතර වන ස්ථාන දිනාගත් අතර සියලුම නිවාස වල ක්‍රීඩකයින්ට වටිනා ත්‍යාග සහ සහතික පත්‍ර බෙදා දුණි. ක්‍රීඩා උළෙල ඉතා අලංකාර සරඹ සංදර්ශනයකින් හා ජිම්නාස්ටික් සංදර්ශනයකින් විචිත්‍රවත් වූ අතර ආචාර පෙළපාලියද ඉතා අභිමානවත් අයුරින් පැවැත්වුණි. උත්සවය අවසානයේ අලංකාර මල් වෙඩි සංදර්ශනයක් ද පැවැත්වුණු අතර ක්‍රීඩා උළෙලේ ප්‍රධාන අනුග්‍රාහකත්වය දැරුවේ විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයයි.

































## තවමත් මෘත ශරීරයෙන් විකිරණ පිටකරන

# මාරි කියුරි

නූතන භෞතික විද්‍යාවේ මව Mother of Modern Physics ලෙස විරුදාවලිය ලැබූ මාරි කියුරි මැතිණිය විද්‍යා ක්ෂේත්‍ර දෙකකින් (භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව) නොබෙල් ත්‍යාගය දෙවරක්ම හිමි කරගත් ලොව ජනප්‍රියම කාන්තා විද්‍යාඥවරිය වෙයි.

ඇය සිය සැමියා වූ ප්‍රංශ භෞතික විද්‍යාඥ පියුරි කියුරි සමග එක්ව 1898 වර්ෂයේදී ජූනි මාසයේ නව මූලද්‍රවයක් සොයා ගන්නීය. එය පොලෝනියම් යනුවෙන් නම් කරන්නේ ඇය උපන් රට වන පෝලන්තයට ගෞරව කිරීමක් වශයෙනි.

ඉන්පසු ඇය විසින් එම වර්ෂයේම දෙසැම්බර් 26 වැනි දින රේඩියම් නැමති මූලද්‍රව්‍යය සොයා ගත් අතර එම සොයා ගැනීම ඇයට 1911 වර්ෂයේ රසායන විද්‍යාව වෙනුවන් නොබෙල් ත්‍යාගයෙන් පිදුම් ලැබීමට දොරටු විවර කලාය.

මාරි කියුරි මැතිණිය මිය ගොස් අදට වසර 86කට ආසන්න කාලයක් ගත උනත් ඇය විසින් පරිහරණය කල ඇඳුම් ආයිත්තම්, ගෘහ භාණ්ඩ සහ සටහන් පොත් අද වන විටත් විකිර්ණශීලි (radioactive) බවෙන් යුක්ත වන්නේ මේ අසහාය විද්‍යාඥවරිය විකිරණශීලි ද්‍රව්‍ය සමග කෙතරම් පර්යේෂණ කරන්නට ඇත්දැයි ලෝකයාට පෙන්වා දෙමිණි.



ප්‍රංශයේ ජාතික වස්තූන් ලෙස සැළකෙන කියුරි මැතිණිය පරිහරණය කල දෑ වලින් අද වන විටත් විකිරිණ නිකුත් වන අතර එම විකිරිණශිලිත්වය තව අවුරුදු 1500 පමණ කාලයක් පවතියි යැයි විද්‍යාඥයින් ප්‍රකාශ කර සිටි.

මේ මහා විද්‍යාඥවරිය විකිරණශීලී ද්‍රව්‍ය සමග සිදුකල පරේයේෂණ වලදී කිසිදු ආරක්ෂක පියවරක් අනුගමනය නොකළ අතර විකිරණශීලි රසායන ද්‍රව්‍ය දැමූ විදුරු නළ සිය පර්යේෂණ කබායේ තබා ගැනීමට පුරුදු වී සිටියාය. එමෙන්ම එම නල වල ඇති රසායන ද්‍රව්‍ය රාත්‍රී කාලයේ කොළ පැහැයෙන් දිළිසෙන විට එවා දෙස බලා සිටීම ඇයට මහත් ආශ්වාදයක් ගෙන දෙන්නක් විය.

ප්‍රංශයේ ජාතික පුස්තකාලය වන The Bibliothèque Nationale de France හි ඉතා සුරක්ෂිත ලෙස තැම්පත් කර ඇති කියුරි මැතිණියගේ ආයිත්තම් නැරඹීමට පැමිණෙන අමුත්තන් රේඩියම් (226) විකිරණවලින් ආරක්ෂා වීමට ආරක්ෂක ඇදුම් පැළදීම අනිවාර්යය වෙයි.

එකල ඇයගේ සිරුර තැම්පත් කර තිබු මිනී පෙට්ටියෙන් පවා විකිරිණ පිට වු නිසා අගලක් පමණ ඝනකම් ර්යම් වලින් එම මිනී පෙට්ටිය නිමවා තිබිනණී. 1995 වර්ෂයේ මෙම අසහාය විද්‍යාඥවරියගේ භෂ්මාවශේෂ ප්‍රංශයේ කීර්තිමත් පුරවැසියන් මිහිදන් කර ඇති පැන්තන් නම් සුසානයේ මිහිදන් කර කර ඇති අතර එය නැරඹීමට යන අමුත්තන් පවා විකිරණවලින් ආරක්ෂා වීමට ආරක්ෂක ඇදුම් පැළදිය යුතු වෙයි.

උපුටා ගැනීම - අන්තර්ජාලය මගිනි



විකිරණශීලිතාව නැමැති ක්ෂේත්‍රයේ පතාක යෝධයෙකු වන මාරි කියුරි මැතිණිය පොලෝනියම් සහ රේඩියම් යන මූලද්‍රවය සොයා ගනිමින් විද්‍යා ලෝකයේ දියුණතිය උඩු යටි කුරු කිරීමට සමත් වුවාය.
එම මූලද්‍රවය වල ඇති විකිරණශීලීතාවය නිසාම 1934 වර්ෂයේ ජූලි 4 වැනි දින **Plastic Anaemia** නැමති රෝගයෙන් පෙළෙමින් ඇය මෙලොව හැර ගියාය.

# 5-S

දෙවන ලෝක යුද්ධය නිසා අන්තයටම මැඩී ගිය රටක් තමයි ජපානය නමුත් එතරම්ම ආගාධයට වැටුණු ජපන් වැසියන්ගේ ජීවිත වර්තමානය වන විට ඉතා ශීඝ්‍ර දියුණුවක් අත්කරගෙන සිටීම පුදුමයට කරුණකි. එම දියුණුවේ රහස ඔවුන් තමන්ගේ දියුණුව සලසා ගැනීමේ දී අනුගමනය කළ එක් සුවිශේෂී ක්‍රම ශිල්පයකි. එම ක්‍රම ශිල්පය අපි 5S ක්‍රමය හෙවත් ජපන් පංචවිධ සංකල්පය ලෙස හඳුන්වමු. මුලින්ම බලමු මොකක්ද මේ 5S ක්‍රමය කියන්නේ කියලා

## සෙයිරි (සංවිධිත බව)

මෙම පියවරේදී අවශ්‍ය දෑ හා අනවශ්‍ය දෑ හඳුනාගැනීම හා අනවශ්‍ය දෑ බැහැර කිරීම අපේක්ෂා කෙරේ. අපට ජීවිතයේදී අවශ්‍ය හා අනවශ්‍ය දේවල් කොතෙකුත් හමුවේද? එහිදී බුද්ධිමත්ව එවා අවශ්‍ය හා අනවශ්‍ය දේ ලෙස නිරවුල්ව වෙන් කරගෙන අවශ්‍ය දේ ජීවිතයට එක්කරගෙන අනවශ්‍ය දේ නොපමාව ඉවත දැමිය යුතුය. මෙය ඔබගේ කාමරයෙන් අරඹනවානම් වඩාත් ප්‍රතිඵලදායක වේ. මන්දයත් ඕනෑම අභියෝගයක් ජය ගන්නට පෙර තමන්ගේ වටපිටාව ගුණාත්මක තත්ත්වයෙන් පවත්වා ගැනීම ඉතා වැදගත් වන නිසාය.

## සෙයිතොන් (සුපිළිවෙල)

අවශ්‍ය දෑ පහසුවෙන් පරිහරණය කළ හැකි පරිදි පිළිවෙළකට සකස් කර ගැනීම මෙහිදී සිදු කළ යුතුවේ. පෙර පියවර ඔබ සාර්ථකව නිමකළේ නම් දැන් ඔබ ළඟ ඔබට අනවශ්‍ය කිසිවක් තිබිය නොහැකිය. උදාහරණයක් ලෙස ඉගෙනුම් පරිසරයක් ගත්කල එ වටපිටාව තුළ ඔබ වෙන් කරගත් අවශ්‍ය දේ ඔබට පහසුවෙන් සොයාගත හැකි, පරිහරණයට ගත හැකි ස්ථාන වල ස්ථානගත කර ගත යුතුවේ. විභාග යකට සූදානම් වීමේදී කාලය නාස්ති කරගැනීම ඉතා අනුවණ ක්‍රියාවක් බැවින් ඉහත ලෙස කටයුතු කළ විට කාලය නාස්ති නොවී ඉතා ඉක්මනින් අවශ්‍ය දෑ සොයා ගත හැකිය.

## සෙයිසො (සුපිරිසිදුකම)

අවට නිසි පරිදි පවිත්‍රව තබා ගැනීම මෙයින් අදහස් කෙරේ. පවිත්‍ර වටපිටාව අන් අයට මෙන්ම තමන්ටද මානසික සහනයක්, ප්‍රසන්න බවක් ගෙනදෙයි. මෙය අධිවේගීව අධ්‍යයන කටයුතුවල නිරත වීමට හොඳම උත්ප්‍රේරකයක් වනු ඇත. ඉගෙනුම් පරිසරයක් තුළ සිටින විට චිත්ත එකාග්‍රතාවයද හොඳින් දියුණු වේ. ඔබ කරන කියන දේ පාරිශුද්ධත්වයෙන් යුතු වේ නම් එ ඔබගේ උතුම් අරමුණ මස්තකප්‍රාප්ත කරගැනීමට මඟ පෙන්වනු ඇත.

## සෙයිකෙත්සු (සම්මිතිය)

පෙර සඳහන් කළ සෙයිරි සෙයිතොන් හා සයිසො අදියරයන් නිසි පරිදි නොකඩවා පවත්වාගෙන යෑම, නැතහොත් වැඩිදියුණු කිරීම මෙහිදී සිදුවිය යුතුවේ. මේ තුළින් ඔබ කරන කාර්යයෙහි ගුණාත්මක භාවය ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වේ. නිසි පරිදි සැලසුමකින් යුතුව උසස් පෙළ විභාග යට මුහුණ දීමට මෙමගින් ඔබට අවස්ථාව සැළසේ. මෙකී සැලසුම් සහගත බව විභාගයෙන් විශිෂ්ට ප්‍රතිඵලයක් ලබාගැනීමට උපකාරයක් වන බව නොඅනුමානය.

## සිත්සුකේ (ශික්ෂණය)

5S අනුගමනය කරන ඔබ මෙම සංකල්පය පිළිබඳව අන් අයද දැනුවත් කිරීම සිදු කළ යුතුය. එසේම මෙය ජීවන පුරුද්දක් ලෙස දිගින් දිගටම පවත්වාගෙන යෑමට ඉහත පිය පියවර මනා පිටුවහලක් වේ. කාලයෙන් උපරිම ලෙස ප්‍රයෝජන ගැනීම, වේලාවට වැඩ කිරීම, මනා කළමණාකාරීත්වයකින් යුක්තවීම මේ ඔස්සේ ඔබට ලැබිය හැකි ප්‍රතිලාභ වේ.




*ජපන් පංචවිධ සංකල්පය ක්‍රියාවට නංවන ඔබ හට වැඩි ඵලදායිතාවයකින් යුතුව ඉහළ චිත්ත ධෛර්යයෙන් යුතුව, එමෙන්ම උපරිම ගුණාත්මක භාවයෙන් යුතුව ජීවිතය ජය ගැනීමට හා මෙරටත් සුරපුරයක් කිරීම අපහසු දෙයක් නොවනු ඇත.*

මූලාශ්‍රය - අන්තර්ජාලය

K.G.P.D.
2021 A/L Maths





# රාහුල බාලදක්ෂයින්ගේ 69 වන සංවත්සර සැමරුම

1951 වසරේ සැප්තැම්බර් 21 දින ඩී.ජේ. කුමාරගේ විදුහල්පතිතුමන් ගේ හා එවකට විද්‍යාලයීය ඉංග්‍රීසි භාෂා ආචාර්ය එස්.එච්.ඒ සේනානායක මහතාගේ ප්‍රධානත්වයෙන් බාලදක්ෂයන් විසි දෙනෙකුගේ සහභාගීත්වයෙන් ඇරඹි රාහුල විද්‍යාලයීය බාලදක්ෂ සමූහය මේ වන විට ජනාධිපති බාලදක්ෂයන් රැසක් ලොවට දායාද කළ ව්‍යාපාරයක් වී ඇත.

1957 වසරේ පටන් සෑම ලෝක ජම්බෝරියක් සඳහා ම ලංකාව නියෝජනය කළ රාහුල බාලදක්ෂයන් 2008 වසරේදී එවරස්ට් කඳු මුදුන සාර්ථකව තරණය කරන ලදී.

2011 වසරේ ඇරැඹි සිංහයන්ගේ පිබිදීම ගවේෂණ තරගාවලිය මේ වන විට සමස්ත ලක්දිව ප්‍රමුඛතම බාලදක්ෂ ගවේෂණ තරගාවලියක් බවට පත්ව තිබෙන්නේ රාහුල බාලදක්ෂයින්ගේ මනා සංවිධානාත්මක බව තුළිනි.

බාලදක්ෂ වැඩ සතියේ දිවයිනේ වැඩිම මුදලක් ඉපයීම වෙනුවෙන් පිරිනමන ඇන්ඩෲ කෝල්ඩිකේට් කුසලානය හිමිකර ගත් රාහුල විද්‍යාලයීය බාලදක්ෂයන්

තවද වැඩිම ජනාධිපති බාලදක්ෂයන් බිහි කළ පාසල් අතරින් තුන්වන ස්ථානයට පත් ව ඇත.

එවන් අභිමානයක ට උරුමකම් කියන රාහුල විද්‍යාලයේ බාලදක්ෂ සමූහය ආරම්භක දිනයට 69 වසරක් සපිරෙන 2020 සැප්තැම්බර් 21 වන දින ගිනිමැලයෙන් එකාලෝක වත් විය. මෙම අවස්ථාව සඳහා විද්‍යාලයේ විදුහල්පති ෆ්‍රැන්සිස් වෙලේගේ ගුරු පියාණන්, මැලිබන් පුද්ගලික ආයතනයේ නිෂ්පාදන කළමනාකාර විපුල හැරිසන් ද සිල්වා මහතා ඇතුලු ආරාධිත අමුත්තන්, මාතර දිසා බාලදක්ෂ ආචාර්ය V.G.ඉන්දික ප්‍රසන්න මහතා, විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිවරුන්, බාලදක්ෂ ආචාර්යවරුන්, විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයේ ගුරු මාපියන්, දෙමාපියන් සහ බාලදක්ෂයන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.










# "So close but yet so far"

*It has already been a year since health officials cited Wuhan's Huanan seafood wholesale market as ground zero for the covid19 pandemic. The World Health Organization is still on the search of the absolute origins of the virus but there has been very little time to look back, the corona virus has been rampaging through the globe with devastating effect.*

*The impact of covid19 in every aspect has been quite extraordinary. Rightly so, it is considered as the global health calamity of the century as well as the greatest challenge to humankind since the world war two. The number of reported covid19 cases worldwide as of February 2021 stands over 111 million and the death toll is at a staggering number of 2.45 million. United States of America, France, Italy and Spain have been struck heavily by the pandemic while the United Kingdom and India are following not far behind. Prince Charles, former American president Donald Trump, British prime minister Boris Johnson and French president Emmanuel Macron are amongst the long list of elites who have contracted the deadly virus.*



රාහුලය 2020

Economies have been hit and unemployment has risen to unimaginable heights while over 213 governments around the globe continue the struggle of unending testing, treating, tracing and quarantining of covid19 suspects and patients. Just to touch on the magnitude, over 20 million jobs have been lost in the United States of America during the month of April. Furthermore, millions of people are driven to the extreme risk of falling into poverty while the number of undernourished people who are currently estimated at 69 million, could rise up to 132 million in the near future. Social disparity, sexual abuse and family tensions too have climbed up the pecking order of calamities as never witnessed before.

Corona virus made its Sri Lankan debut on the 27th of January, in the form of a 44 year old Chinese woman from Hubei province China. First reported case of Sri Lankan origin outside the homeland was reported on the 3rd of March in Italy. The ceries of curfews and quarantine regulations were followed immediately after a tour guide in contact with a group of Italians tested positive for the virus on the 10th of March. As of April 16th , Sri Lanka was named the 16th high risk country prone to the pandemic. It all seemed well and smooth for a space of about three months and seemed as if everything was back to square one yet again, but the devil was only down and not out. Unfortunately, covid19 rekindled apparently through the Brandix textile factory in Minuwangoda and has not let up ever since.

Countries around the globe have taken up the challenging task of developing vaccines to counter the corona virus. A big breakthrough came recently when Pfizer/BioNTech published its first results in November showing the efficiency of up to ninety five percent with no side effects or other health concerns. Moderna and Astrazeneca vaccine developed by the Oxford university are amongst the other newly produced successful vaccines . Authorities in charge also face an uphill battle of distributing vaccines around the world while preserving its qualities under the required conditions.

Many countries have prepared to risk loosing in order to win the war against covid19. Nations worldwide have refused the idea of going in to lockdown on account of entertaining this concept. They have resolved to the task of continuing usual proceedings amidst the vast interruptions by the ongoing pandemic. The virus proves to show new forms of itself every now and then, making things ever so difficult for us to adapt.



The whole situation in Sri Lanka in terms of covid19 prevention and management strategies has changed drastically since I first started focusing on the content of this magazine. Since then, Sri Lanka has taken a giant leap in a positive direction with the introduction of the Astrazeneca vaccine to the local community. Mass vaccination programmes are being carried out with full efficiency throughout the country in the aspiration of reviving our motherland. The quarantining rules and regulations have also been subjected to slight changes recently. On the other hand, a deadly strain of the virus which was originally found in the UK has made its terrifying appearance in Sri Lanka as well. The number of infected people and the death count continues to rise keeping the entire country on edge.

All in all, this is the nature of a pandemic and we are all in this scuffle together. As a nation as well as a globe, we surely can see the light at the end of the tunnel. What will be significant is the manner in which we get there. In order to do that, we must learn from our past and focus on what we want to achieve in the future. There will be no easy way outs, and a very fine margine for error. Each and every person must identify and fulfill their set of obligations towards this greater course. There will be bumps along the road, but we will have to take them on the chin and strive forward with purpose. The whole world will have to unite as one because we certainly cannot do this without eachother.



# මොන දේවල් කළත් ඒක හරියට කරන්න

## විදුහල්පති ෆ්‍රැන්සිස් වෙලේගේ

**රාහුලය සඟරාව නව වැඩසටහනක්, පාසලට මෙවැනි සඟරාවක් තිබීමේ වැදගත්කමක් තිබේනවාද? ඒ පිළිබඳව ඔබතුමාගේ අදහස කෙටියෙන් කියන්න පුළුවන්ද?**

අනිවාර්යෙන්ම පාසලකට මෙවැනි සඟරාවක් තිබීම ඉතාම වැදගත්. විශේෂයෙන් දිවයිනේ ජනප්‍රිය පාසල් බොහෝමයකම එම පාසලටම ආවේණික වුණු සඟරාවක්, පුවත්පතක් හෝ සමහරවිට කිහිපයක් එළි දක්වනවා. එමනිසා පාසලකට අතිශයින්ම මෙවැනි සඟරාවක්, පුවත්පතක් නිකුත් කරන එක බොහොම වැදගත්. ඊට හේතුව එමඟින් සිදුවන්නේ පාසල සම්බන්ධ බොහෝ කරුණු වගේම එදිනෙදා යාවත්කාලීන වන තොරතුරු විශේෂයෙන්ම පාසලේ ප්‍රජාව හැටියට පාඨකයින්ට, ආදි ශිෂ්‍යයින්ට, දරුවන්ට, දෙමව්පියන්ට බොහෝ දෙනෙකුට දැනගන්න ලැබෙනවා.

ඒවගේම දරුවන්ගේ හා ගුරුවරුන්ගේ විවිධ නිර්මාණ සඟරාව හරහා එළිදැක්වීමට අවස්ථාව ලැබෙනවා. හුගක් වෙලාවට දැන් පාසල් පද්ධතිය තුළ මේ වගේ ගුරු-සිසු සම්බන්ධතාවයකින් යුක්තව ක්‍රියාත්මකවන වැඩසටහන් ගොඩක් අඩුයි අන්න ඒ නිසා මේ වගේ සඟරාවක් වගේ වැඩසටහනක් හරහා වුනත් ශිෂ්‍යයන් සහ ගුරුවරුන් විතරක් නෙවෙයි, ශිෂ්‍යයන් සහ දෙමව්පියන්, ශිෂ්‍යයන් සහ ආදිශිෂ්‍යයන් අතරත් සබඳතා ගොඩනගන්න පුළුවන්. ඒ වගේම අන්තර් ශිෂ්‍ය සබඳතාවය වඩාත් තහවුරු කරගන්න පුළුවන්.

**දශක ගණනාවකට පසුවයි නැවත ව්‍යාපෘතියක් ලෙස ආරම්භ වන්නේ. මෙම සඟරාවේ ප්‍රකාශන සහ ප්‍රධාන සම්බන්ධීකරණය සිදුකරන්නේ රාහුල විද්‍යාලයේ හිටපු 2020/21 ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායකයින් ඔවුන් ඔවුන්ගේ ධුර කාලය තුළදී පවා පාසල වෙනුවෙන් මෙම ව්‍යාපෘතිය සහ අනෙකුත් ව්‍යාපෘති රැසකටම සම්බන්ධ වීම ගැන ඔබතුමා දකින්නේ මොන විදියටද?**

ඒ ගැන ඇත්තටම මම දකින්නේ ඉතාමත් සුභදායී ආකල්පයකින් ඇත්ත වශයෙන්ම කියනවනම් 2020 වසර කෝවිඩ් වසංගතය නිසා අභියෝග වලින් පිරුණු වසරක් උනා. වර්ෂයේ සෑහෙන කාලයක් පාසල විවෘත කරන්න හැකියාවක් ලැබුණේ නෑ. ඒත් විටින් විට පාසල් විවෘත කරපු අවස්තා වලදී ඒ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක මණ්ඩලයේ පුතුන් ඉතාමත් වටින සාර්ථක වැඩසටහන්, ව්‍යාපෘති විශාල සංඛ්‍යාවක් පාසල වෙනුවෙන් ඉටු කලා. කාලයට ගැළපෙන විදියට අවස්ථාවට ගැලපෙන විදියට විශාල වැඩ කොටසක් ඔවුන් රාහුලය වෙනුවෙන් කලා. මේ සඟරා ව්‍යාපෘතියත් ඔවුන් විසින් නැවත අරම්භ කිරීම ගැන මට සතුටු වෙන්න පුලුවන්.

**ආදිශිෂ්‍ය මව් සංගමය, කොළඹ ආදිශිෂ්‍ය සංගමය, ඇතුළු ආදිශිෂ්‍ය සංගම් රැසක් ශිෂ්‍යත්ව වැඩසටහන්, තවත් ගුණාත්මක සංවර්ධන, ක්‍රීඩා ආදී වැඩසටහන් රාශියක් පාසල වෙනුවෙන් සිදු කරනව, ඒවාට අවශ්‍ය මූල්‍ය අනුග්‍රහයත් දක්වනවා. පාසලට ආදි ශිෂ්‍යයන්ගෙන් ලැබෙන දායකත්වය ගැන ඔබතුමාගේ අදහස කුමක්ද?**

පාසලක් එක්තරා මට්ටමකට දියුණු කිරීම පමණයි විදුහල්පතිවරයාට සීමාවක් පවතිනවා ගුරුවරුන්ටත් සීමාවක් පවතිනවා, දෙමව්පියනුත් එහෙමයි. එතනින් එහාට තවත් ඉදිරියට ගෙනියන විට අනිවාර්යෙන්ම ආදිශිෂ්‍යයන්ගේ සහයෝගය අවශ්‍ය වෙනවා. විශේෂයෙන්ම රාහුල විද්‍යාලයීය ආදිශිෂ්‍ය මව් සංගමය, කොළඹ ශාඛාව, තවදුරටත් තියෙනවා තවමත් දියුණුවන ශාඛා මහනුවර මොණරාගල සහ අනුරාධපුර වැනි ශාඛාත්. ඒවගේම එක්සත් අරාබි එමීර් රාජ්‍යය, මහා බ්‍රිතාන්‍ය, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය වැනි ලෝකයේ වෙනත් රටවල් වලත් ජාත්‍යන්තරව ක්‍රියාත්මක වෙන ආදිශිෂ්‍ය සංගමයේ ශාඛාවන් තියෙනව. ඒවගේම විශේෂයෙන්ම සඳහන් කළ යුතුයි ආදිශිෂ්‍ය වසර කණ්ඩායම්. පාසලේ දියුණුව සඳහා විශේෂයෙන්ම භෞතික සම්පත් සංවර්ධනය සඳහා, ශිෂ්‍ය ශුභසාධනය සඳහා, අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් සඳහා මෙම වසර කණ්ඩායම් දායක කරගන්න මට පුළුවන්කම ලැබුණා පසුගිය වසර තුනක කාලය තුළ සමස්ත ආදිශිෂ්‍ය සංගමය රුපියල් ලක්ෂ 500 ක විතර වැඩසටහන් ප්‍රමාණයක් සිද්ධ කරල තියෙනවා. ඔවුන්ට ස්තූතිවන්ත වෙනව ඒවගේ තමන් අධ්‍යාපනය ලැබූ පාසල වෙනුවෙන් විශාල කාර්යභාරයක් සිදුකිරීම සම්බන්ධයෙන්.

**පාසල් සිසුවාගේ ගුණාත්මක අධ්‍යාපනයකට හිතකර පාසල් පරිසරයත් වැදගත් "රාහුල 2020" වැඩසටහන මේ වන විට විශාල වැඩකොටසක් ඒ වෙනුවෙන් සිදුකර තිබෙනවා නේද?**

රාහුල 2020 වැඩසටහන 90% ක්ම අවසන් කරලා තියෙන්නෙ. විශේෂයෙන්ම දැන් බොහොම ආකර්ෂණීය සහ සෞන්දර්යාත්මක මට්ටමේ පාසල් පරිසරයක් බිහිවෙලා තියෙනවා. මෙහිදී තවමත් ක්‍රීඩාපිටිය තමයි අඩුවකට තියෙන්නේ. දරුවෙක් අධ්‍යාපන කටයුතු සඳහා පැමිණෙන පාසලක හෝ වෙනයම් ස්ථානයක හෝ ඉගැන්වීම සඳහා ඉතාම නිරවුල් මනසක් අවශ්‍ය වෙනව. අන්න ඒ සඳහා ඒ පරිසරයේ තියෙන සුන්දරත්වය, ප්‍රියමනාපත්වය ඉතාම වැදගත් වෙනවා. එවිට ඒ තුළින්ම තමන් එදිනෙදා අධ්‍යනය කරන ඉගැන්වීම් කටයුතු, ඉගෙන ගන්න විෂය කරුණු වඩාත් හොඳින් අවබෝධකරගන්න දරුවන්ට හැකියාව ලැබෙනව. එනිසා මේ හිතකර පාසල් පරිසරය, පාසල් පිරියත යහපත් වූ අධ්‍යාපනයක් සඳහා බෙහෙවින්ම ඉවහල් වෙනවා යන්න තමයි මගේ මතය.

**පාසල තුළින් සමබර ශිෂ්‍යයන් බිහිකිරීමට අධ්‍යාපන විභාග ජයග්‍රහණවලට අමතරව ක්‍රීඩා සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් කොතරම් දුරට වැදගත් වෙනවද?**

ගොඩක් වැදගත් වෙනව. අධ්‍යාපනය කියල කියන්නෙ එක අංශයක් විතරයි. අසුන්ගත අධ්‍යාපනයක් නැත්නම් විභාග ඉලක්ක අධ්‍යාපනය කියල කියන්නෙ අධ්‍යාපනයේ එක අංගයක් පමණයි.ඒ හැරෙන්නට යහපත් වූ සමබර පෞර්ෂයක් සඳහා ක්‍රීඩාව ඇතුළු අනෙකුත් විෂය බාහිර විෂය සමගාමී ක්‍රියාකාරකම් ඉතාමත්ම වැදගත් වෙනව. ක්‍රීඩා සහ විෂය බාහිර ක්‍රියාකාරකම් තුළින් තමයි විශාල සමාජානුයෝජනයක් වෙන්නෙ, විශාල පිරිසක් ආශ්‍රය කරන්න ලැබෙන්නෙ. එතනදි කතාබහකරන, ඇසුරු කරන, ගැවෙන පුද්ගලයන් විවිධයි. එතුළින් විවිධාකාරයේ අන්තර් පුද්ගල සබඳතා ගොඩනැගෙනව. එතකොට ඒ වගේ කෙනෙකුට කණ්ඩායමක් එක්ක වැඩකරන්න ලැබුනට පස්සෙ ඒ පිරිස, කණ්ඩායම මනාව හසුරුවාගෙන, කළමණාකරනය කරගෙන යම් අරමුණක් කරා කණ්ඩායමක් මෙහෙයවීමේ හැකියාව පතපොතේ අධ්‍යාපනය විතරක් ලබපු කෙනෙකුට වඩා පහසු වෙනව.

**මෙම සඟරාවෙන් ඊට යම් හෝ උපකාරයක් වෙනවද?**

ඔව්, මේක අපිට ඉතින් අර අපි කතාවක් කියනවනෙ විශාල දෙයක් කරන්න බැරිනම් පුංචි දෙයක් හරි සිද්ධ වෙන එක අපි අගය කරනව කියල, අඳුරට ශාප කරන්නෙ නැතුව එක පහනක් හරි දල්වන එක තමයි සිද්ධ වෙන්න ඕන කියල. ඒ නිසා බාහිර ක්‍රියාකාරකම් වලින් දරුවන් ඈත්වන යුගයක මේ වගේ ක්‍රියාකාරකම්වලට යොමු වීම මම බෙහෙවින්ම අගය කරනව. ඇත්තටම මම විශ්වාස කරනව අර තියෙන අඩුව යම් පමණකට හරි මේ තුළින් පුරවන්න පුළුවන් කියල. දෙමව්පියන්ටත් වඩා, ගුරුවරුන්ටත් වඩා ශිෂ්‍යයන් කාර්යබහුල යුගයක මෙවැනි උත්සාහයක් ගන්න එක මම අගය කරනව.

**මෙම සඟරාවට අඩිතාලම රාහුල වාර්ෂික නායකත්ව කඳවුරයි. එයත් මේ 2019 වර්ෂයේ සිට රාහුලයට එක්වූ අප පාසලට අනන්‍ය වූ වැඩසටහනක් නේද? ඒ ගැන ඔබතුමා දක්නිනේ කුමන ආකාරයටද?**

ඒ වැඩසටහන ඉතාම වැදගත්.මම දන්නෙ නැහැ තවත් ඉදිරියට තියෙව්ද කියල නමුත් අපි දන්න තරමින් දකුණු පළාතෙ නම් කිසිම පාසලක මෙවැනි වැඩසටහනක් ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. අන්න ඒනිසා මේක ඉතාම වැදගත්. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්, ක්‍රීඩාව, අනෙකුත් ක්‍රියකොරකම් නැවත මතක් කරලා දීලා ඒවට දරුවන් පොළඹවා ගන්න ඒවගේ වැඩසටහනක් දියත් වෙන එක හොඳයි. එනිසා සමහරවිට අමතක වෙලා ගියපු බොහෝ දේවල් නැවත මතක් වෙන්න පුළුවන්, ඒවගෙන් ජීවිතේට එකතු කරගන්නත් පුළුවන්කම ලැබෙනව.

**2021 උසස් පෙළ කණ්ඩායමේ සිට පාසලේ උසස් පෙළ කණ්ඩායම් ව්‍යාපෘති මාලාවක් නව උසස් පෙළ සිසුන්ට හඳුන්වා දෙනවාද?**

විශේෂයෙන්ම 2021 ඉඳලා නායකත්ව පුහුණු කඳවුර හරහා අපි ඇත්තටම විෂය මාලාවට හඳුන්වල දීල තියෙන්නෙ දරුවන්ට යම්කිසි ගවේෂණයක් කරල සමීක්ෂණයක් කරල තොරතුරු රැස් කරල ඒවගේ ක්‍රියාකාරීව ව්‍යාපෘතියකට දායක වෙන්න. අපි දැන් මේ ව්‍යාපෘති 2021 උසස් පෙළ කණ්ඩායමේ ඉඳලා ඉදිරියට හඳුන්වල දෙන්න උත්සහ කරනව. පාසලට අවශ්‍යයැයි කියල හිතෙන, පාසලට වැදගත් යැයි හැගෙන ව්‍යාපෘති මාලාවක්. එතකොට ඒ ව්‍යාපෘති මාලාවෙන් එකක් තමයි දරුවෝ තෝරගන්න ඕන. ඒක ඒ දරුවන්ගෙ අනාගතයේදි කවදාහරි දවසක ඒ වගේ ස්වාධීනව, තමන් විසින්ම තොරතුරු හොයල ඒවගේ සිදුකරන ව්‍යාපෘතියක් තුළින් ලබාගන්න අත්දැකීම් ටික අනාගතයේදි ඒ දරුවන්ට වැදගත් වෙනව.

**අවසාන වශයෙන්, රාහුල විද්‍යාලයේ 2020/21 ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායකයින් මෙම රාහුලය සඟරාවට සම්බන්ධ වෙනවා. ඒ ගැන ඔබතුමාගේ අදහස සහ උපදෙස් මොනවද?**

මම මුලින්ම ඔවුන්ට සුබ පතනවා. විශේෂයෙන්ම අගය කරනව මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන්. මොකද මෙවැනි ව්‍යාපෘතියකට ගොඩක් වෙලාවට හුගක් සිසුන් කැමති නැහැ. දැන් හුගක් අය කැමති අර කලින් කිව්ව වගේ සුදු කරපටි රැකියාවක් කරනව වගේම සැහැල්ලුවෙන් වැඩිය මහන්සි වෙන්නෙ නැතුව යමක් කරන්න. දැන් අද තියෙන වැඩිම ප්‍රවණතා රටාව තමයි ඒක. ඒත් මෙවැනි සඟරාවක් කරන්න ගියාම මහන්සි වෙන්න ඕන. එනිසා මේ ව්‍යාපෘතිය තෝරා ගැනීම සම්බන්ධයෙන් ඔවුන්ට මම ස්තුතිවන්ත වෙනවා මේ වගේ ඵලදායී ව්‍යාපෘතියක් තෝරා ගැනීම සම්බන්ධයෙන්. ඒ වගේම උපදෙස් කියල මට විශේෂයෙන් දෙන්න දෙයක් නැහැ.ඔවුන් ඉතාමත් හො!දින් මුල ඉ!දලම මේ ව්‍යාපෘතිය කරගෙන ගියා. නමුත් මම පොදුවේ සියලූම සිසුන්ට කියන්නෙ මොන දේවල් කළත් ඒක හරියට කරන්න, කැපවීමෙන් කරන්න, මහන්සියෙන් කරන්න එවිට එහි අවසන් ප්‍රතිඵලය ඔබට බොහොම සතුටින් භුක්ති විඳින්න පුළුවන් වෙනව.

# මතකයන්

මොනවද මේ මතකයන් කියන්නෙ? ජීවිතේ එක එක නැවතුම්පොළවල් වලදී හිතපු විදියට හිතපු නැති විදියට එක එක විදියට වෙච්චි සිද්ධි කිව්විවොත් අපි අපේ හිත හොදට එහෙම නැත්නම් අපි අපේ හිත හදාග න්න මේ මතකයන් කොටස් දෙහෙකට වෙන් කර ගන්නවා. ඉන් එකක් තමයි සතුටුදායක මතකයන්, එහෙනම් අනිත් එක දුක්කදායක මතකයන් වෙන්න එපයි නේද? එත් මම කැමතියි මගේ මතකයන් වෙන විදියකට මගේ කරගන්න. අමතක උන මතකයන්, අමතක කරපු මතකයන්, අමතක කරමින් තියන මතකයන් සහ අමතක නොවෙන මතකයන්. නුපේ හන්දියේ පැත්තේ ඉදන් එද්දී ඊළගට හමුවෙන හතරමන් හන්දියෙන් වමට හැරිලා, අමතක නොවෙන මතකයක් දිගේ ටිකක් හරි ඇවිදන් ගිහින් බලන්න මට හිතුණා.

මම ඉගනගත්තේ මාතර රාහුල විද්‍යාලයේ. ඉතින් මගේ ඉස්කෝලේ ප්‍රාථමික අංශය තිබ්බේ ඔය මම කිව්වා හතරමං හන්දියෙන් වමට ගියාම. ඉස්කෝලේ වටේම සුද්ද කරන්න එක එක පන්ති වලට ඒ කාලේ බෙදල දීලයි තිබ්බේ. හතයි විස්සට විතර එක බෙල් එකක් වදිනවා. ඒ සද්දෙට අපි පන්ති වලට දුවන්න ඕන. හැබැයි අවුරුදු පහක මගේ ප්‍රාථමික පාසල් ජීවිතේ කවදාවත් ඒ බෙල් එකට පන්තියට දුවල නෑ. එකට හේතුව තමයි හතයි විසි පහ වෙද්දී ගහන අනිත් බෙල් එක. අපි එකට කිව්වේ ගල් බෙල් එක කියල. මොකද ඒ බෙල් එක වැදුනම කවුරු උනත් ඉන්න තැනම සීරුවෙන් හිටින්න ඕන. ඉතින් ඔය බෙල් එක ගහද්දි පන්තියේ දොර ගාව හිටිය කෙනා උනත් ගල් වෙන්න ඕන. ආයෙම ගහන බෙල් එකට තමයි අපි සාමාන්‍ය තත්වෙට හැරෙන්නේ. අදටත් ඒ ගල් බෙල් එක ගැහුවේ ඇයි කියල එක ගහපු අපේ කැන්ටිමේ අන්කල්වත් නොදන්නවා ඇති.

බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි මේ ආගම් තුනේම ළමයි අඩු වැඩි වශයෙන් හිටිය මගේ ඉස්කෝලේ අදටත් ආගමික වතාවත් කරන්නේ බෞද්ධයන්ට විතරයි. ඒ උනත් අපි සස්නාත් ගේන වටලප්පම් කෑවේ මිහරෝන් ගේන ඩේට් කේක් කෑවේ එකාට එකා උදුරගෙන. උදේ පාන්දර යන ,උදෑසන පුවත්, අස්සේ සිරිත් මල්දමේ කවිත් කියවනවා. සිරිමත් වගේ හොද ළමයෙක් වුනත් නොවුනත් ඒ පොතේ එන කවි කියන්න මාධ්‍ය ඒකකයේ හිටිය එකම කෙනා මම. මාව ඒ වගේ ලස්සන වැඩකට සම්බන්ද කරගෙන ඒ වැඩේ කැත උනාද කියලත් දැන් මට හිතෙනව.

හෙමින් හෙමින් වෙලාව හරි අමාරුවෙන් ගත වෙලා යන්නේ ඉන්ටවල් එකට. එකටත් බෙල් දෙකක් තියනව එකක් ටීචර් පන්තියෙන් නැගිටලා යන එක, අනික ගහන්න කලින් අපි කෑම පෙට්ටිය මෙසේ උඩින් තියල "මේ කෑම එක ලබා දුන්" කියල පටන් ගන්නවා. වෙන මොකටද ඉතින් පින් දෙන්න ඇරෙන්න. පින් දුන්නට පස්සේ ඉතින් කෑම කනවා කියන්න බෑ, ගිලිනවා. විනාඩි විස්සක ඉන්ටවල් එකේ අපි විනාඩි දහහයක්වත් සෙල්ලම් කරන එපැයි.

පන්ති කාමර යි අපේ ග්‍රවුන්ඩ් එකයි වෙන් වෙලා තිබ්බේ පුංචි බැම්මකින්, ඇත්තමට එක පුංචි බැම්මක් කියල තේරුනේ මේ මෑතකදී. එකේ වෙනම කතාවක් තියනවා. ඉස්සර ඔය බැම්ම අපිට වඩා චුට්ටයි කොට. හැබැයි ඒ එක දෙක වසරේ ඉද්දි. තුන හතරහට එද්දී අපිට ඕකෙන් පැනල ග්‍රවුන්ඩ් එකට යන්න පුළුවන්. හැබැයි එක තහනම්. ඔය බැම්මෙන් පනිනවා දැක්කොත් ලොකු සර්ගෙන් පොඩියට ගුටි කන්න වෙනවා. ඒ මොනවා උනත් ඒ කලේ ඔය බැම්මෙන් පැනල සර්ට අහු නොවී එන එකා එන්නේ හරියට "මේ හුනා" ෆිල්ම් එකේ ශාරුක් ඛාන් එනවා වගේ. ඒ තරන් එක ලොකු වැඩක්.

ලොකු නමක් තිබ්බ ඉස්කෝලෙ අපිට තිබ්බේ පොඩි ග්‍රවුන්ඩ් එකක්. ඒ හින්ද අපි කරෙත් පොඩි පොඩි සෙල්ලම් තමයි. ,අල්ලන සෙල්ලම්,. මේක ඒ කාලේ මුළු ඉස්කොලයක්ම කරපු සෙල්ල්ලමක්. පොඩ්ඩක් හිතල බලන්න ඉතින් දවසට දනිස් කියක් නම් තුවාල වෙන් ඇත්ද කියල. පහේ පන්තියේ උනත් එකේ පන්තියේ උනත් කගේ පිලේ උනත් බේරෙන්න නම් දුවල දුවල ගිහින් අපි කෝං ගහ අල්ලන්න ඕන. මොකද එක තමයි "ටයිම් එක". කොන් ගහ වටේට විස්සක් තිහක් ටයිම් කියා කියා ඉන්නවා නොදක්කොත් ඒ අපේ ඉන්ටවල් වෙලාවක නෙවෙන්න පුළුවන්.

මට මේ කොන් ගහ එක්ක බැදිච්ච මතකයක් තියනවා. කෝන් ගහ උසයි, බදන්න හිතන්නවත් බැරි තරම් මහතයි. ඒ කාලේ හැටියට කිව්වොත් අර කවුදෝ දිව්‍යලෝකෙට ගිය ගහ වගෙයි මට මේක පෙනුනේ. අපේ ඉස්කෝලේ හිටිය ලොකු සර්ගේ නමෙත් එක කොටසක් "අබේකෝන්". උඩ රැවුල විතරක් වවපු, හරි අඩුවෙන් හිනා උන අබේකෝන් ස.රැයි මේ කෝං ගහයි මට පෙනුනෙම එක වගේ, රවාගෙන ඉන්නවා වගෙයි.



ඒ හින්දම ඒ දවස්වල මම කරේ පුළුවන් තරං ග්‍රවුන්ඩ් එක වටේම දුවපු එක බැරි වෙලාවත් ටයිම් එක ගාවට ආවත් මම හිටියේ ඇගේ කලිසම තෙත් වෙන තරන් බයකින්. අබේකෝන් සර් කාලයක් ගිහින් පෙන්ෂන් ගියා. එත් තාමත් කොන් ගහ මං දිහා බලන් ඉන්නේ රවාගෙන!

පසන් සමරතුංග
ප්‍රධාන ශිෂ්‍ය නායක 2016/17

















රාහුලය 2020

# හෙට ලොවට රාහුලෙන් නායකයෙක්

## Archons of Rahula

රාහුල සිසුන් අධ්‍යාපනයෙන්, ක්‍රීඩාවෙන් මෙන්ම නායකත්වයෙන්ද ඉතා පරිපූර්ණ වූ පිරිසක්. 97 වසරක් පුරාවට රාහුලයෙන් බිහි වූ නායකයින් සඳහා උදාහරණ ඕනෑතරම් තිබේ. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වත්මන් කථානායක ධුරය දරන මහින්ද යාපා අබේවර්ධන මහතාද රාහුලයෙන් බිහිවූ නායකයෙකි. ඊට අමතරව ආරක්ෂක අංශ වල, පරිපාලන ක්ෂේත්‍රයේ සහ වෙනත් නොයෙකුත් අංශ වල රාහුලයෙන් බිහිවූ නායකයින් බොහෝය. රාහුල විද්‍යාලයීය ශිෂ්‍ය නායක මණ්ඩලය එසේ නායකයින් බිහිවන ප්‍රධානතම අංශයයි. පාසල් සිසුන්ට නායකත්වය සපයන අතරම පාසල් සිසුන් අතරින්ද නායකයින් බිහිකිරීමට ඔවුන් සැමවිටම කටයුතු කරයි. එසේ නායකයින් බිහි කිරීමේ අරමුණින් රාහුල විද්‍යාලයීය 2020/21 ශිෂ්‍ය නායක මණ්ඩලය සංවිධානය කළ දෙදින නායකත්ව පුහුණු වැඩමුලුවක් සැප්තැම්බර් මස 7 සහ 8 යන දෙදින පුරා රුහුණු විශ්ව විද්‍යාලයේදී පැවැත්විණි. **Archons of Rahula** නමින් හැඳින්වුණු මෙම නායකත්ව පුහුණු වැඩමුලුව රාහුල විද්‍යාලයෙන් 2022 වසරේ අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටින් සිසුන් මූලික කොටගෙන පැවැත්විණි. ඉතා වැදගත් දේශන සහ ක්‍රියාකාරකම් මෙම වැඩසටහනට ඇතුළත් වූ අතර දේශකවරුන් ලෙස වෛද්‍ය ධනුජ මහේශ් මහතා, වෛද්‍ය චමින්ද කුමාර මහතා, වෛද්‍ය ටී.ඒ.එස් ප්‍රභාත් මහතා, ගාල්ල සහ මාතර යුධ හමුදා කඳවුරු භාර ආඥාපති බ්‍රිගේඩියර් කීර්ති කෝට්ටවත්ත මහතා, ගන්දර පොලිස් ස්ථානයේ පොලිස් ස්ථානාධිපති කපිල බණ්ඩාර මහතා යන මහත්වරුන් මෙන්ම මාතර දිස්ත්‍රික් ළමා හා කාන්තා කාර්යංශයේ පොලිස් ස්ථානාධිපති වරුණි බෝග හවත්ත මහත්මියද සහභාගී වූහ. රුහුණු විශ්වවිද්‍යාලයීය උපකුලපති මහාචාර්ය සුජීව අමරසේන මහතා සහ රුහුණු විශ්වවිද්‍යාලයීය නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය සමන් එදිරිවීර මහතා විශේෂ සහයෝගයක් දැක්වූ අතර වැඩමුලුව සඳහා ප්‍රධාන අනුග්‍රාහකත්වය රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය දැරූ අතර **DFCC** බැංකුව සම අනුග්‍රාහකත්වය දරන ලදී. වැඩසටහන අවසානයේ සහභාගී වූ සිසුන් සඳහා වටිනා සහතිකයක් පිරිණැමීමටද ශිෂ්‍ය නායක මණ්ඩලය කටයුතු කරන ලදී.





# ආස නැද්ද එක දවසකට හරි සිංහයෙක් වෙන්න



එක්තරා අවස්ථාවක සුප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙක් වුනු "ඩෑන් ලොග්" නැමැත්තා පවසනවා. "ඔබට ඔබේ අනාගතයේ සිදුවන දෑ තීරණය කිරීමට නොහැකි උනාට ඔබට ඔබේ අනාගතය වෙනුවෙන් සිදුකල හැකි පුරුදු තීරණය කිරීමට පුළුවන්" කියලී මේ ලෝකය කියල කියන්නේ හිරු එලිය, දේදුනු වලින් පිරිච්ච හරි ලස්සන තැනක් නෙවෙයි. මේ ලෝකය හරි අමුතු ගුප්ත තැනක්. මේ ලෝකය දවසක ඔබට පයින් ගහයි ඔබ දනින් වැටෙන්නම් හැබැයි ඔබ තීරණය කරනවනම් දන ගහල ජීවත් වෙන්න, ලෝකය එයට ඔබට ඉඩ දේවී හැබැයි ඔබට අවශ්‍ය නම් දනින් නැගී සිටින්නට, ඔබට බාදක ගොඩක් ජයගන්නට වේවි.

අපි හැමදාම උදේට අපේ alarm එකට නැගිටින්නේ බලාපොරොත්තු සිය ගණනක් එක්ක. ඒක ඇත්තයි. බලාපොරොත්තු තමයි අපිව ජීවත් කරවන්නේ. මාටින් ලූතර් කිං විටෙක පවසනවා "ඔබට මැරීගෙන සිදුකිරීමට කටයුත්තක් නොමැති තාක්කල් ඔබ ජීවත් වීමට නුසුදුස්සෙක්" කියල. ඒ නිසා පුලුවන් හැම වෙලාවෙම හීන වලට පන දෙන්න උත්සාහ කරන්න. ඒ ගමනෙදි ඔබ බොහෝ අවස්ථාවල වැටේවි. ඔබේ බලාපොරොත්තු සුන් වෙලා යාවි. හැබැයි ඔබ නවතින්නට එපා. මොකද දුක වැහෙන්න වකිඑැර ගැහුවොත් සතුට කියන්නේ හැමදාත් ඔබට මායාවක්ම විතරක් වේවි. ඒ නිසා උත්සාහ කරන්න. දිනනකම් උත්සාහ කරන්න. ඔබ හොදට මතක තියාගන්න. මේ ලෝකේ දිනපු මිනිස්සු අරුම පුදුම මායා කාරයෝ නෙවෙයි. ඔවුනුත් ඔබ වගේම සාමාන්‍ය මිනිස්සු. නමුත් ඔවුන්ට තිබුනා අර්මුණක්. එදා ණක ව්‍යාපාරය ආරම්භ කරනකොට ඔවුන්ගේ වට්ටෝරුව 990 වතාවකට වැඩිය ප්‍රතික්ෂේප වෙනවා, ක්‍රිස්ටියානෝ රොනාල්ඩෝ තමන්ගේම පාසල් පාපන්දු කණ්ඩායමෙන් අදක්ශයෙක් කියල ඉවත් කරනවා, තමන්ම නිර්මාණය කරපු apple සමාගමෙන් ස්ටීව් ජොබ්ස් ඉවත් කරනවා. නමුත් ඔවුන් වැටුනේ නැහැ. ඔවුන් ආපහු නැගිට්ටා. ඒ නිසා ඔවුන් අදටත් ලෝක පූජිත පුද්ගලයන්. ඉතින් ඔවුන්ට පුලුවන් උනානම් ඇයි අපිට බැරී?? ඒකට හේතුවක් තියෙනවා. ඔවුන් ලග නොතිබුනු අපි ලග තිබෙන හේතුවක්. අපි බයයි අලුත් අඩියක් ඉස්සරහට තියන්න. ඔව් ඇත්ත අපි බයයි තමයි. බය කියනදේ අපි උපදිනකොටම අතේ මිට මොලොවගෙන එන දෙයක්. හැබැයි එදා අපි ලග තිබ්බේ බය ආකාර දෙකයි. එකක් අධික ශබ්ද වලට තිබෙන බය.අනෙක වර්ධනය වීමට තිබෙන බය.ඒ නිසා තමයි අපි ඉපදෙනකොටම අඩාගෙන ඉපදෙන්නේ. හැබැයි එතනින් පස්සේ නිර්මාණය උනු හැම බයක්ම නිර්මාණය කරගත්තේ අපිමයි. අපිට පුලුවන් නම් ඒ බය නැති කරගන්න, අන්න එදාට අපිටත් පුලුවන් දිනන්න.

ආස නැද්ද එක දවසකට හරි සිංහයෙක් වෙන්න. උත්සාහ කරල බලන්න බැරිකමක් නෑ. මොකද එක දවසකට හරි සිංහයෙක් වෙන එක නම්බුකාරයි මුලු ජීවිත කාලෙම බැටලුවෙක් වෙලා ජීවත්වෙනවට වඩා. මොකද මේ ලෝකේ කියන්නේ කැලයක්. ඔබට මේ කැලේ රජකරන්න ඕන නම් ඔබට සටන් කරන්නම වෙනවා.එහෙම නැති උනොත් මුලු ජීවිත කාලෙම බැටලුවෙක් වගේ දුව දුව ජීවත් වෙන්න වේවි. ඔබ හිතනවද ඔබ එයට පොඩි වැඩී කියල? නැහැ මොකද Size එක ප්‍රශ්නයක් උනානම් අද කැලේ රජා සිංහයා නෙවෙයි. ඔබේ සෙරෙප්පු අඩිය පොඩි උනාට යන්න ලොකු මාවතක් තිබෙනවා." ඔබ දන්නවද ස්ටීව් ජොබ්ස්, එලොන් මස්ක් වගේ පුද්ගලයින්ට පොදු උනු සාධකයක් තියෙනවා. ඒක තමයි උග්‍ර ආත්ම විශ්වාසය.ඒ නිසා තමයි ඔවුන්ට Apple, Tesla, Space X වගේ සමාගම් ගැන අදහස ඇති උනේ. ඒ නිසා මුලින්ම ඔබ ඔබව විශ්වාසය කරන්න. එතකොට මුලු ලෝකයක් ඔබව විශ්වාස කරාවි. ඇමරිකානු ව්‍යවසායිකා සාරා බ්ලේක් සම්මුක සාකච්ඡාවකදී පවසනවා "මේ ලෝකයේ ජීවත්වන සෑම මනුෂ්‍යයෙක්ම ඩොලර් මිලියන ගනනක අදහසක හිමිකරුවන්. නමුත් ඔවුන් බොහෝ පිරිසක් එය ක්‍රියාත්මක කරන්න උත්සාහ කරන්නෙවත් නැහැ" කියල. ඉතින් දවසක ඔබට පුලුවන් නම් ඔබේ ඇග ඇතුලේ ඉන්න original ඔබව හොයාගන්න, අන්න එදාට ඔබටත් පුලුවන් වේවි මේ ලෝකෙම කතා කරන brand එකක් වගේ පුද්ගලයෙක් වෙන්න.

ඔබ දිනන්න යන ගමනෙදි ඔබ අනිත් අයගෙන් ආදර්ශ ගන්න, හැබැයි ඔවුන්ව අනුකරණය කරන්න එපා. මොකද ඔබ ඔහු නෙවෙයි. ඒ විතරක් නෙවෙයි, ඔබ ඔබේ වටේ ඉන්න හැමෝම සතුටු කරන්න යන්නඑපා. මොකද එහෙම උනොත් ඔබට ඔබේ සතුටත් නැති වේවි.මේ ගැන ස්ටීව් ජොබ්ස් හරි ලස්සන කතාවක් කියනවා "ඔබට හැමෝගෙම ආදරය අවශ්‍ය නම් ice cream විකුණන්න" කියල. ඉතින් අනිත් අය නිදා ගනිද්දි ඔබ නිදිමරන්න, අනිත් අය වියදම් කරද්දි ඔබ ඉතිරි කරන්න. දවසක සත්තයි අනිත් අය හීන දකින විදියට ඔබට ජීවත් වෙන්න පුලුවන් වේවි.නව දෙයක් තියෙනවා, ඔබ ඉස්සරහට අඩියක් තියද්දි මුලු ලෝකයම ඔබට බැහැ කියාව ඔබව වට්ටාවි.හැබැයි ලෝකයා ඔබව වලලන හැම මොහොතකම බීජයක් වෙලා පැළවෙන්න උත්සාහ කරන්න.

"රූමි" කියන දාර්ශනියා විටෙක පවසනවා "ඔබේ හදවත බිදෙන වාරයක් වාරයක් පාසා එය බිදෙන්නට ඉඩ හරින්න. මක්නිසාදයත් දිනෙක ඔබේ හදවත ලෝකයාට විවරවේවි" කියල. ඉතින් ප්‍රශ්න කියන දේවල් අපි හැමෝටම පොදුයි. හැබැයි ප්‍රශ්නය තමයි ඒ ප්‍රශ්න එකිනෙකාට බලපාන්නේ එක එක විදිහට. කෙනෙක් තමන්ගේ දෙමාපියන්ගේ මුදල් වලින් අධික සැප විදිද්දි, ඔබට ඔබේ ජීවිතය අඩිතාලමේ ඉදන් හදන්න වෙලා ඇති. හැබැයි කරන්න දෙයක් නැහැ, මොකද අපිට එයට කතා කරන්න අයිතියක් නැහැ. හැබැයි ලෝකය ඔබට දිනන්න අවස්ථා ලබා දේවි. මොකද මේ ලෝකේ දිනපු මිනිස්සු උපතින්ම සල්ලිකාරයෝ නෙවෙයි. ඒ නිසා ඔබේ අවස්තා හැම වෙලාවෙම ප්‍රයෝජනයට ගන්න. ඒවා මගහරින්න එපා. ලෝකය ඔබට එකම අවස්ථාව දෙවතාවක් දෙන එකක් නැහැ.

හොදට මතක තියාගන්න. පුලුවන් හැම වෙලාවෙම අහස අල්ලන්න try කරන්න. හැබැයි පොලොවේ පය ගහල ජීවත් වෙන්න. ඔබට අවශ්‍යනම් ජීවිතය දිනන්න. හිත හිත ඉන්නේ නැතුව උත්සාහ කරල බලන්න.

ඔබට ජය

සතිර වෙල්ලප්පුලි
19/20 ජ්‍යේෂ්ඨ ශිෂ්‍ය නායක

# වසරේ විශිෂ්ඨතම ශිෂ්‍යයා - 2018

## ඩිතිර වෙල්ලප්පුලි



ආයුබෝවන්

1. සම්පූර්ණ නම සඳහන් කළොත්..

මගේ නම ඩිතිර යසස්වින් වෙල්ලප්පුලි

2. පවුලේ විස්තර කෙටියෙන්

අම්මයි, තාත්තයි, මල්ලී සහ මම තමයි අපේ පවුලේ ඉන්නේ.

3. දැනට ඉගෙනුම ලබන විශ්වවිද්‍යාලය හා හදාරණ උපාධිය පිළිබඳ යම් විස්තරයක්

මම දැනට කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පළමු වසරේ අධ්‍යන කටයුතු සිදුකරනවා

4. ශිෂ්‍යත්ව විභාගයේ,සාමන්‍ය පෙල විභාගයේ හා උසස් පෙල විභාගයේ ඔබ ලබාගත් ප්‍රතිඵල සහ දිවයිනේ ඔබ ලබාගත් ස්ථාන

ශිෂ්‍යත්ව විභාගයෙන් මට ලකුණු 178 ක් ලබාගෙන පාසලෙන් තෙවෙනියා වීමට පුලුවන් උනා. සාමාන්‍ය පෙළ විභාගයෙන් දිවයිනෙන්ම 8 වැනියා වීමටත්, උසස් පෙළ විභාගයෙන් මාතර දිස්ත්‍රික්කයේ 9 වැනියා වීමටත් හැකි උනා.

5. පාසලේ සිදුකල විෂය බාහිර ක්‍රියාකාරකම් මොනවද? ක්‍රීඩා, බාලදක්ෂ, ශිෂ්‍ය බට යනාදී සහ එවයින් ඔබ ලබාගත් ජයග්‍රහණ මොනවද?

මම 2008/09 ප්‍රාථමික අංශයේ ශිෂ්‍ය නායකයෙකු ලෙසත්, පෝතක බාලදක්ෂයෙකු ලෙසත් කටයුතු කලා. ඒ වගේමයි ප්‍රාථමික අංශයේ මාධ්‍ය ඒකකයේද සාමාජිකයකු ලෙසද කටයුතු කලා.

ඉන් පසුව ද්විතියික අධ්‍යාපනය ලබන කාලයේදී 2014-2017 දක්වා ශිෂ්‍ය නායක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස වසර 4ක් පුරාවට මාගේ දායකත්වය ලබා දුන්නා. ඒ වගේමයි පිහිනුම් ක්‍රීඩාවේ හා වෙස් ක්‍රීඩාවේද නිරත උනා.

6. පාසල් තුල විවිධ සංගම් වල කටයුතු කලේ නම් ඒ මොනවද ? එවයේ ඔබ දැරූ තනතුරු හා එම සංගම් වල ඔබේ ක්‍රියාකලාපය කොයි වගේද? (එම සංගම් නියෝජනය කරමින් ඔබ තරග වලට ඉදිරිපත් වුයේ නම් එවයින් ඔබ ලබාගත්තු ජයග්‍රහණ යනාදී දේවල් තමයි අපි අහන්නෙ)

ඔව් පාසල් කාලය තුලදී මට සංගම් රාශියට මගේ දායකත්වය ලබා දෙන්න හැකි වුනා. පාසල් දැනුම මිනුම සංචිතයේ 2016/17 සභාපතිවරයා ලෙස මෙන්ම ඔලිම්පියාඩ් සංචිතයේ සාමාජිකයෙකු ලෙසද අවස්ථා ගණනා වකදී පාසලට ජයග්‍රහන ලබා දීමට මට පුලුවන් වුනා. එමෙන්ම ශාන්ත ජෝන් ගිලන් රථ සේවයේ සාමාජිකයෙකු, විද්‍යා සංගමයේ සාමාජිකයෙකු, පරිසර නියමු සංගමයේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කිරීමට හැකිවුනා. 2018/19 වසරේදී රාහුල ලියෝ සමාජයේ සභාපති ධුරයද, 2013-2015 රාහුල ශිෂ්‍ය කවුන්සිලයේ සභාපති ධුරයද හොබවමින් මාගේ සක්‍රීය දායකත්වය ලබාදීමට හැකි වුනා.

7. පාසලේ විෂය සමගාමී කටයුතු වලදි ඔබේ දායකත්වය මොන වගේද?

ශ්‍රී ලබාගති ජාත්‍යන්තර ජයග්‍රහණ පිලිබද සදහන් කලොත්,

2017 ජාත්‍යන්තර භූ විද්‍යා ඔලිම්පියාඩ් තරගාවලියේදී ලංකාව වෙනුවෙන් ලෝකඩ පදක්කම දිනා ගැනීම, 2016 ජපානයේ පවත්වන ලද **Sakura Science Program** හි දකුණු පළාත නියෝජනය කිරීම සදහන් කරන්නට පුලුවන්. ශ්‍රී සමස්ත ලංකා ජයග්‍රහණ ලෙස 2018 රසායන විද්‍යා ඔලිම්පියාඩ් තරගාවලියේ ජාතික සංචිතයට තේරී පත්වීම, 2017 භූවිද්‍යා ඔලිම්පියාඩ් තරගාවලියේ සමස්ත ලංකා ප්‍රථම ස්ථානය දිනා ගැනීම. 2014 ඉංග්‍රීසි දින නිර්මාණාත්මක රචනය සමස්ථ ලංකා දෙවන ස්ථානය දිනා ගැනීම, 2014 *දැයේ ජයක්-පෝශනයෙන් සපිරි රටක්* අන්තර් පාසල් දැනුම මිනුම තරගාවලියේ අනුශූරතාවය දිනු කණ්ඩායම නියෝජනය. 2016 සමාජ විද්‍යා තරගාවලියේ සමස්ත ලංකා 8වන ස්ථානය දිනා ගැනීම, 2012 කනිෂ්ඨ තාරකා විද්‍යා ඔලිම්පියාඩ් තරගාවලියේ කුසලතා දිනා ගැනීම යනාදිය පිලිබදව සතුටින් මතක් කල යුතුයි. ශ්‍රී ඉංග්‍රීසි දින 2012, 2014, 2015, 2017 පලාත් ජයග්‍රහන ලබාගැනීම, 2014, 2015 වසර වල දකුණු පලාත් සාහිත්‍ය කලා මහෝත්සවයේ ජයග්‍රහන ලබාගැනීමටද හැකි විය. 2008 වසරේ සිට 2015 වසර දක්වා නොකඩවා වාර්ශික ත්‍යාගප්‍රදානෝත්සවයේදී ත්‍යාග ලබා ගැනීමටද මෙන්ම ශිෂ්‍යත්ව රාශියක් දිනා ගැනීමටද හැකිවිය. 2011-2015 සිංහල භාෂා දින තරග ජයග්‍රහණ මෙන්ම 2010-2018 දක්වා වසර වල ඉංග්‍රීසි දින තරගාවලි වලදීද ජයග්‍රහන රැසක් ලබා ගැනීමට හැකි විය.

8. අපේ අනාගතය තීරණය කරන කඩයිම් විභාගය තමයි උසස් පෙළ කියන්නෙ.. ඔබ ඒ කඩයිම විශිෂ්ට ලෙස ජයගත්තු කෙනෙක්.. ඉතින් අපිට කියන්නකො ඒ කඩයිම ජයගන්න ඔබ ඔබේ වැඩකටයුතු සිදුකළේ කොහොමද කියලා..

උසස් පෙළ විභාගය කියන්නෙත් ජීවිතයේ අපිට මුහුණ දෙන්න තියෙන එක් වැදගත් අභියෝගයක්. මම කියන්නේ නැහැ උසස් පෙළ විභාගයෙන් ඔබේ මුළු ජීවිතයම තීරණය වෙනවා කියලා. නමුත් උසස් පෙළ විභාගයට ඔබ මුහුණ දෙන ආකාරය අනුව ඔබේ අනාගත බලාපොරොත්තු වෙනස් වෙන්න පුලුවන්. ඔබට ඇත්තටම කරන්න සිදුවන වෘත්තිය ඔබේ සිහින වෘත්තියට වඩා ගොඩක් වෙනස් වැදගත්ම කාරණය, උසස් පෙළ වෙන්නත් පුලුවන්. ප්‍රතිඵලය කියන්නේ ඔබේ ගුරුවරුන්ගේ හෝ දෙමාපියන්ගේ හෝ හිත මිතුරන්ගේ මහන්සියේ ප්‍රතිඵලයක් නෙවෙයි. ඔබේ ගුරුවරු ඔබට දැනුම දෙන්න කොතරම් උත්සාහ කළත්, ඔබේ දෙමව්පියන්, නෑදෑයන්, හිත මිතුරන් ඔබට මොන තරම් අවවාද දුන්නත්, ඔබේ ප්‍රතිඵලය සඳහා ඔබ මහන්සි වෙන්නෙ නැත්තම් ඒ සියල්ල නිෂ්ඵල වෙනවා. ඒ නිසා ඔබ විසින්, ඔබ වෙනුවෙන්, ඔබේ අනාගතය වෙනුවෙන් සිදුකිරන කැපවීම හා මහන්සිය මත ඔබේ උසස් පෙළ ප්‍රතිඵල තීරණය වෙනවා කිව්වොත් නිවැරැදියි. මම හැම වෙලේම මම ගැන විශ්වාස කළා. උසස් පෙළ කියන්නෙ මේ ලෝකෙ අමාරුම විභාගය කියලා කට වහරට කිව්වත් මම එක විශ්වාස කරන්නේ නැහැ. මුල ඉඳලාම තමන්ගේ අරමුණු වෙනුවෙන් කැපවීමෙන් වැඩ කළොත් ඕනෙම අභියෝගයක් ජය ගන්න පුලුවන්. උසස් පෙළත් ඒ වගේ.

9. ඒ අභියෝගය ජයගන්න පවුලෙන් පාසලෙන් යාලුවන්ගෙන් ලැබුනු සහයෝගය මොන වගේද?

මට මගේ දයාබර අම්මාගෙන්, තාත්තාගෙන් වගේම පාසලේ ගුරු මෑණිවරුන්ගෙන්, පියවරැන්ගෙන් විශාල දිරි ගැන්වීමක් ලැබුණා. ඒ වගේම මගේ මිතුරන්ගෙන් ලැබුණු සහයෝගයත් මට ලොකු ශක්තියක් වුනා. පුලුවන් හැම දවසකම පාසල් ගිහින් පාසලෙන් ලබාගන්න පුලුවන් උපරිම දැනුම සහ අත්දැකීම් ලබාගන්න මම උත්සාහ කළා. පාසලේ ඉගෙනුම් කටයුතු විතරක් නෙවෙයි, පාසල තුළ කරපු හැම ක්‍රියාකාරකමක්ම අද වෙනකොට සුන්දර මතක රාශියක් බවට පත් වෙලා. පාසලේ සිදු වු හැම සිදුවීමක්ම වගේ ජීවිතයට විවිධ අත්දැකීම් එකතු කළා.

10. පාසල් ජීවිතයේ මුහුනදෙන්න උන ලොකුම අමතක නොවෙන අභියෝග මොනවද?

2017 අගෝස්තුවේ ප්‍රංශයේ පැවැත්වුණු ජාත්‍යන්තර භූ විද්‍යා ඔලිම්පියාඩ් තරගාවලියට සුදුසුකම් ලැබුවට පස්සේ එහි පුහුණුවීම් වලට මාස ගණනාවක් පුරා පේරාදෙණිය විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය, ආතර් සී. ක්ලාක් ආයතනය වගේ තැන් වලට යන්න මට සිදුවුණා. ඒ අතරතුර උසස් පෙළ අධ්‍යාපන කටයුතු සහ අනෙක් විෂය බාහිර කටයුතුත් සමබරව කරගෙන යන්න සිදු වුනා. භූ විද්‍යාව තාරකා විද්‍යාව පොසිල විද්‍යාව කාලගුණ විද්‍යාව සහ වගේ උසස් පෙළ ජීව විද්‍යා විෂය ධාරාවට සම්බන්ධයක් නැති අලුත් විෂයන් රාශියක් කෙටි කාලයක් තුළ ඉගෙන ගැනීමත්, අනෙක් වැඩ කටයුතු සමබරව කර ගැනීමත් ඒ මොහොතේ ලොකු අභියෝගයන් වුනා. කෙසේ හෝ ඒ අභියෝග දෙකම ජයගන්නත්, පෙර කී තරගාවලියෙන් ලංකාවට පදක්කම් දිනා දෙන්නත් මට හැකියාව ලැබුණා.

11. අධ්‍යාපනික වශයෙන් පසුබෑම් වලට ලක්වෙන්න සිද්දවුනු අවස්ථා තියනවද? එහෙම අවස්ථා තිබ්බනම් එවට ඔබ මුහුණ දුන්නෙ කොහොමද?

ඕනෑ තරම් තිබෙනවා. අනික් හැම දේකදිම වගේ අධ්‍යාපනයේදිත් ජයග්‍රහණයන් මෙන්ම පරාජයන්ට ලක් වෙන්න ඕනම කෙනෙක්ට සිදු වෙන්න පුලුවන්. මමත් විවිධ පසුබෑම් වලට ලක්වු අවස්ථා ඕනෑ තරම් තිබ්බා. එවැනි අවස්ථා වලදි ගුරුවරුන්ගෙන් සහ හිත මිතුරන්ගෙන් අවවාද ලබාගෙන, සිදුවුණු පසුබෑම් පන්නරයක් කරගෙන ඉදිරියට යන්න හැකියාව ලැබුණා.

12. ඉස්සරහට උසස් පෙළ විභාගයට පෙනී ඉන්න සූදානම් වන සිසුන්ට ඔබට දෙන්න පුලුවන් පණිවුඩය මොකක්ද? (උපදෙස්, දිරිගැන්වීම් වගේ දේවල්)


ඉදිරියේදී උසස් පෙළට මුහුණ දෙන්න ඉන්න මල්ලිලා, නංගිලාට කියන්න තියෙන්නෙ හැමවෙලේම තමන්ව විශ්වාස කරන්න. මුල ඉඳලාම අරමුණක් වෙනුවෙන් කැපවීමෙන් වැඩ කරන්න. අධ්‍යාපනය නිසා අනෙක් විෂය බාහිර සහ විෂය සමගාමී කටයුතු අත්හරින්න එපා. මොකද පාසල් ජීවිතය ආයෙ කවදාවත් ලැබෙන්නෙ නෑ. ඒ කාලය ඇතුළත ලබාගන්න පුලුවන් සෑම අවස්ථාවක්ම පාසල තුළින් ලබාගන්න. ඔබට පාසල වෙනුවෙන් හෝ ඔබේ දක්ෂතාවක් ඉදිරිපත් කිරීමට හෝ ලැබෙන අවස්ථා මගහැරගන්න එපා. එවාට ඉදිරිපත් වෙන්න. අලුත් අත්දැකීම් ලබාගන්න. එත් ඒ හැම කටයුත්තක්ම අතරෙ අධ්‍යාපනයට ප්‍රමුඛත්වය දෙන්නත් අමතක කරන්න එපා.

13 අනාගත බලාපොරොත්තු මොනවද?

මේ රටට, සමාජයට වැඩදායී පුරවැසියක් වීම තමයි බලාපොරොත්තුව.



රාහුලය 2020




# රාහුල පා ගමන 2020

රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන වැඩසටහන් අතුරින් ප්‍රධානතම මෙන්ම වැදගත්ම වැඩසටහන වනුයේ රාහුල විද්‍යාලයීය පා ගමනයි. දිවයිනේ කිසිදු පාසලකට නොදෙවෙනි ඉතා දැවැන්ත පා ගමනක් වාර්ෂිකව විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය සංවිධානය කරයි. රාහුල විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ සංවිධාන ශක්තියත් නිර්මාණශීලීත්වයත් එකමුතු බවත් ආදි සිසුන් වුවද පාසල කෙරෙහි තවමත් ඔවුන්ගේ සිත් තුළ ඇති හැඟීමත් මේ පාගමන තුළින් මනාව විද්‍යාමාන වෙයි. පහලොස් දහසකට අධික රාහුලයින් සංඛ්‍යාවක් මෙවර පාගමන සඳහා එකතු වූ අතර අනුග්‍රාහක භවතුන් විශාල පිරිසක්ගේ අනුග්‍රහයෙන් පා ගමන ශක්තිමත් විය. රාහුල විද්‍යාලයීය ක්‍රීඩා සංවර්ධන අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම පා ගමන සංවිධානය කෙරුණු අතර විද්‍යාලයේ විදුහල්පතිතුමන්, ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය නායක මණ්ඩලය, තූර්ය වාදක කණ්ඩායම්, බාලදක්ෂ සමූහය, ශිෂ්‍ය බට බණ්ඩය, ක්‍රීඩා ඉසව් නියෝජනය කල සිසුන්, නර්තන කණ්ඩායම්, මෙන්ම වසර කණ්ඩායම් නියෝජනය කළ ආදි සිසුන් විශාල ප්‍රමාණයක් මේ සඳහා එක් විය. හෙලිකොප්ටර් සංදර්ශන නිල්වලා ගඟේ බෝට්ටු සංදර්ශන ආදි නොයෙක් අංග වලින් මෙම පාගමන වර්ණවත් වූ අතර පාසල් භූමියෙන් ආරම්භ කොට මාතර සනත් ජයසූරිය ක්‍රීඩාංගණය දක්වා පැමිණ අවසානයේ සංගීත සංදර්ශනයකින් පා ගමන නිමා විය.































රාහුලය 2020




# නැවතුන බිග්මැච්

රාහුල සෙවනේ ගෙවුන හත් වෙනි වසරේ සොදුරු එක් දිනක්, රාහුලයට තොමසුවට පමනක් නොව මාතරටම තවත් එක් දිගහැරුමකට අවසර පතන දිනයක් විය. නමින් එය රන්දද.. අපේ පාපන්දු මහා තරගය එයයි.. සත් වෙනි වසරෙ මා ලද පළමු රන්දද නරඹපු අත්දැකීම ඒ.. හිරු අවරට ගියත් කළුවරකට ඉඩ නොතබා පිටිය එළිය කල ෆ්ලෑශර් ආලෝක කදම්බය අභිමානය, සහෝදරත්වය, ක්‍රීඩාශීලීත්වය පිරුණු හෝරා කිහිපයකට ඉඩ හසර විවර කර තිබුණා

පිටිය වටා දහස් ගණනින් දෙව්දුහල් ක්‍රීඩාලෝලීන්ගේ එකම ඝෝෂාවක්.. මාතර ක්‍රීඩා තරගයක් නැරඹීමට පැමිණ සිටි ඉහළම ප්‍රේක්ෂක පිරිස මා දුටුවේ එදයි.. කරට කර පැවති උනුසුම් තරගය දඩුවම් පහර දක්වාම ඇදුනා.. අවසානයේ මල්වෙඩි සන්දර්ශනයෙන් අවසන් උන රන්දද අමතක නොවෙන බලාපොරොත්තුව එක්කල තරගයක් වුනා. කාලයත් සමග පාසල් පාපන්දු කණ්ඩායමට තේරීපත්ව ක්‍රීඩාවට ඇලුම් කල අපි හැමෝගෙම එකම බලාපොරොත්තුව උනේ රන්දද ක්‍රීඩා කිරීමයි.. නවය වසරෙදි තේරුණත් සෙල්ලම් කරන්න තව වසර දෙකක් විතර අත්දැකීම් වලින් දක්ෂතා වලින් පොහොසත් වෙන්න වුනා.. රාහුලය මෑත කාලිනව පාපන්දු ක්‍රීඩාවෙන් ජාතික තලයේ ජයග්‍රහණ රැසක් ලබා ගන්න පාසලක් වුනා.. ජාතික කණ්ඩායමට ක්‍රීඩකයන් බිහිකල පාපන්දුවෙන් නම රැන්දු විදුබිමක් උනා.. රන්දද යනු එකී රාහුල පාපන්දුවෙ මංගල්‍යයයි.. මාස දෙක තුනකට පෙර සිටන උදේ සවස පුහුණුවීම් එකදිගට පවත්වන්නට වුනා.. එකී පුහුණුවීම් කාලවකවානුව තුළම සමස්ත ලංකා තරග ආරාධිත පාසල් තරග පැවතීමද ජයග්‍රහණ ලබා ගැනීමට සෘජුවම දායක වූ බව නොරහසක්..

රන්දද වෙනුවෙන් ක්‍රීඩකයින්, පුහුණුකරුවන් කල කැපවීම, මහන්සිය දෙව්දුහල්හි ජය වෙනුවෙන්ම පමනක් නොව ක්‍රීඩාවේ ජීවගුණය, සහෝදරත්වය පිළිබිඹු කරන්නක්ද විය..

*රජීව් මෙත්සර මුනසිංහ*
*ප්‍රධාන ධායක සංධායක සහ උප ප්‍රධාන ශිෂ්‍ය නායක 2017/2018*



# හ ත ර සිං හ ටීච



**ආයුබෝවන් ගුරුතුමියනි..**
ආයුබෝවන් ආයුබෝවන් පුතාලා..

**කොහොමද ඔබතුමියට.. හොදින් ඉන්නවද..?**
ඔව් පුතා බොහොම හොදින් ඉන්නවා..

**සතුටුයි ටීච. අපි අද ආවේ ටිකක් විශේෂ වැඩකට. ඒ තමයි රාහුලය සඟරාව වෙනුවෙන් ඔබතුමියගේ රහල් ගුරු ජීවිතය ගැන විස්තර ටිකක් කතා කරන්න..**
ඔව් පුතා අපි කතා කරමු. මතක තියන හැම දෙයක්ම කියන්නම්..

**ඔබතුමිය අවුරුදු කීයක් විතර රාහුලයේ සේවය කරාද..?**
ම්ම්ම්ම්... මම අවුරුදු 10ක පමණ කාලයක් සේවය කරා..

**එතකොට ඔබතුමිය ඉගැන්වූ උසස් පෙළ විෂය ධාරාව මොකක්ද?**
පුතා මම ජීවවිද්‍යා විෂය තමයි ඉගැන්නුවේ..

**ඔබතුමිය අවුරුදු 10ක් පුරාවට උසස් පෙළ සිසුන්ට ගුරුහරුකම් දුන්නා.. මොන වගේ ගෞරවයක්ද, ප්‍රතිචාරයක්ද ඔබතුමියට ඒ ළමයින්ගෙන් තියෙන්නේ..?**
ඔව් ඇත්තටම ගොඩක් දරුවෝ පුලුවන් වෙලාවට මට කතා කරල දුක සැප බලනවා.. සමහර අය ඇවිත් බලල යන වෙලාවලුත් තියනවා..

**ජීවවිද්‍යා අංශය කියන්නේ හැම අවුරුද්දකම වගේ දිස්ත්‍රික් කුසලතා, ජාතික කුසලතා දක්වන අංශයක් නේද..?**
ඔව් අනිවාරෙන්ම රාහුලය තුළ එය කැපී පෙනෙන දෙයක්. හැම අවුරුද්දකම අපිට සැලකිය යුතු ඉහළ ප්‍රතිඵල ලැබෙනවා.

**පාසලේ ඨරුැබ යදම්ැ ව්‍යාපෘතිය ආරම්භ කලේ ඔබතුමිය.. ඒකේ අරමුණ මොකද්ද..? එහෙම දෙයක් පටන් ගන්න මොන වගේ හේතුවක්ද බලපෑවේ..?**
ම්ම්ම් පුතේ ප්‍රධාන වශයෙන්ම පාසලේ ගරාවැටුණු හරිතාගාරය දැක්කහම මට දුකක් ඇති වුණා.. ඒ කියන්නේ මේ සම්පත ඉස්කෝලේ ළමයින්ට ගිලිහෙනවා.. ඒ හින්දා ළමයින්ට දෙයක් දෙන්න තමයි මම මේක පටන් ගත්තේ.. විශේෂයෙන්ම පාසල් වටපිටාව ළමයින්ට දැකුම්කළු ප්‍රියමනාප පරිසරයක් බවට පත් කිරීම තමයි ප්‍රධානම අරමුණ උනේ..

**විභව ප්‍රශ්න පත්‍ර බැංකුවේ නිර්මාතෘවරියත් ඔබතුමිය..ඒ තුළින් වත්මන් උසස් පෙළ විද්‍යා අංශයේ සිසුන් මහත් ප්‍රයෝජන ගන්නවා. ඇයි ඔබතුමිය මේ වගේ දෙයක් නිර්මාණය කරේ.**
මෙහෙමයි... (දිග හුස්මක් හෙලමින්) අපේ ගොඩක් ළමයින්ට වෙන පලාත්වල ප්‍රශ්න පත්‍ර හොයාගැනීමේ දුෂ්කරතාවයක් තිබුණා.. ඒ කියන්නේ ළමයින් පේපර් එකක් හොයාගත්තම එක තවත් කාටවත් දෙන්නේ නෑ.. ඊත් මේ විභව ප්‍රශ්න පත්‍ර බැංකුව මඟින් ළමයින්ට වගේම ගුරුවරුන්ටත් ඉතාම පහසුවෙන් වෙනත් අයගෙ දැනුම එකතු කරගන්න සහ දකුණු පළාතේ තියන දැනුම වෙන පලාත්වලටත් දෙන්න පුලුවන්. ඒක තමයි මේ විභව ප්‍රශ්න පත්‍ර බැංකුව ආරම්භ කිරීමේ අරමුණ.

**ඔබතුමියගේ ගුරු ජීවිතේ සමහර ශිෂ්‍යයන්ව ඉතාම අමාරුවෙන් ඉහළට ගෙනල්ලා ඇති. එවැනි ශිෂ්‍යයන් කිහිපදෙනෙක් ගැන අදහසක් කියන්න කියල අපි යෝජනා කරනවා..**
ම්ම්ම්ම්.. ගොඩාක් කට්ටිය ඉන්නවා ඉතින්. මම බොහොම ආඩම්බරෙන් කියනවා අද වෙන කොට විශේෂඥ වෛද්‍යවරු 150ක් විතර ඉන්නවා.. එතකොට මුල් රෑන්ක්වල හිටපු අය 170ක් 200ක් විතර ඉන්නවා.. සමහරවිට ඊටත් වඩා වැඩි ඇති.

**ඔබතුමියට මොනවද ඒ ප්‍රතිපල ගැන, ඒ ළමයි ගැන හිතෙන්නේ..?**
ඔව් ඇත්තටම හරිම සතුටුයි. (සතුටු කදුලු වගුරමින්) දැනට ලංකාවෙ ඉන්න හොදම විශේෂඥ වෛද්‍යවරු ගොඩක් මගේ ගෝලයෝ.. විශේෂයෙන්ම අමිල වීරසේකර, සජිත වික්‍රමසිංහ මගේ ගොලයෝ තමා,හෘද රෝග විශේෂඥවරුත් ඉන්නවා.. එතකොට සංජය පරණවාණ ඇතුලු තව ගොඩක් අය ඉන්නවා. එහෙම නම් වශයෙන් කියන්න අමාරුයි.. අමිල විරසේකර කියන්නේ ඉතාමත් දක්ෂයෙක්. එයාගෙ මල්ලි චමින්ද වීරසේකර. එයත් ඉතාම දක්ෂයෙක්. පිරිමි ළමයින් විතරක්ම නෙමෙයි මම උගන්නපු බොහොමයක් ගැහැනු ළමයිනුත් මේ තැන්වල ඉන්නවා..

**රහල් රන්දරු ශිෂ්‍යත්වය කියන්නේ මොකද්ද..? ඔබතුමිය නේද ඒ වැඩේට මූලිකත්වය ගත්තේ..?**
ඔව් ඇත්තටම මට ලොකු ආසාවක් තිබුණා ඒ වගේ දෙයක් කරන්න..



ඒ කියන්නේ අඩුපාඩු තියන ළමයෙකුට හදිස්සියේ සල්ලි කියක් හරි හෝ ද්‍රව්‍යමය ආධාරයක් දෙන්න අපට පුලුවන්කමක් තිබුනෙ නැහැ. ඔහොම හිත හිත ඉන්නකොට මම මේ ගැන පුෂ්පරානි ගුරුතුමිය එක්ක කතා කලා. ඒ අතරතුර තමයි අපේ රාහුල ආදිශිෂ්‍යයෙක් වෙච්ච අතපත්තු මහත්මයා ඇවිල්ලා කිව්වේ එයාගෙ සොහොයුරන් දෙන්නෙක් වෙනුවෙන් මොකක්හරි දෙයක් රාහුලයට කරන්න ඕන කියලා.. අතපත්තු මහත්මය මට කිව්වා ටීචර් කැමති දෙයක් කියන්න කියලා. එතකොට තමයි මම මේ ගැන කිව්වේ. ඊට පස්සෙ කිත්සිරි සර්ට ගිහින් කිව්වම සර් ගොඩක් සතුටු වුණා. අපි 2008/12/28 වෙනිදා ඒක පටන් ගත්තා. එකට ගුරුවරුයි, දෙමව්පියොයි එකතු වෙලා රු.170,000ක් දැම්මා. අද වෙන තුරු ඒකේ පොලියක් තියනවා සතයක්වත් ගත්තේ නෑ. අපි ලක්ෂ 12කට කිට්ටු වෙන්න ඒ හරහා මුදල් ලබා දීලා තියනවා.

**ඔබතුමිය වර්තමාන රාහුලය ගැන මොකද හිතෙන්නේ..?**
වත්මන් මේ වටපිටාව ගොඩක් ලස්සනයි. ඒක තමයි කියන්න තියෙන්නේ. හැබැයි අධ්‍යාපනික පැත්තෙන් ළමයින්ගේ උනන්දුව මදි. එහෙම එකක් තියනවා. ළමයි පාසලේ අධ්‍යාපනය පිළිබදව ලොකු හැගීමක් නෑ. දක්ෂ ළමයි හුගක් රාහුලේ ඉන්නවා.. ඊට වැඩිය මම ගොඩක් දුක් වෙන දෙයක් තමයි වැඩිපුරම දිවයිනේ කුසලතාවයක් රාහුලයෙන් දෙන්න පුලුවන්.ඊත් වර්තමානයේ එහෙම වෙනවා අඩුයි.

**අවසාන වශයෙන් අහන්නම් ඔබතුමියගෙන්, ඔබතුමියට හිතෙන විදියට පාසලේ අධ්‍යාපනික ප්‍රගතිය වැඩි කරන්න මොන වගේදෙයක්ද දැන් රාහුලය කරන්න ඕන?**
ඔව් ළමයි, ඔයිට වඩා ප්‍රායෝගික පැත්තට නැඹුරු වෙන්න ඕන. ළමයින් ඉතින් පොතෙන්මත් නෙමෙයි. තොරතුරු හොයාගන්න පුලුවන් විවිධ ක්‍රම තියනවා. අනික ළමයින්ගේ ඔය කාලෙ ආයේ එන්නේ නෑ. උසස් පෙළ ළමයින්ට ගොඩාක් දේවල් කරන්න තියනවා. ළමයින්ගේ විෂය දැනුම මට්ටම වැඩි කරගන්න. ඒ වගේම දරුවන්ගේ බාහිර ප්‍රායෝගික පැත්ත වැඩි කරන්නම ඕන මොකද රාහුලේ දරුවෝ ඉගෙනීමට, කලාවට, විද්‍යාවට, සංගීතයට, ක්‍රීඩාවට වගේම සෑම දේකටම අති දක්ෂ දරුවෝ. ඒකේ කතා දෙකක් නෑ.

**ඉතින් එහෙනම් බොහොම ස්තූතියි ඔබතුමියගේ වටිනා කාලය අපිට ලබා දුන්නට ඔබ තුමියට අපි නිදුක් නිරෝගි සුබ විශ්‍රාම දිවියක් ප්‍රාර්ථනා කරනවා. තෙරුවන් සරණයි..**
ඔය දරුවන්ටත් බොහොම ස්තූතියි රාහුලය සඟරාවට මගේ අදහස් ලබා ගත්තට. මම රාහුලයට ජය ප්‍රාර්ථනා කරනවා.



## Lets Go Green

# සොබාදහම සඳහා කාලය

පරිසරය සුරැකීම මිහිපට ජීවත් වන සියලු දෙනාගේ වගකීමක් මෙන්ම යුතුකමකි. මන්ද අප සියලු දෙනා රැකෙන්නේ පරිසරය නිසාවෙනි. රාහුල සිසුන් සැමදා පරිසරය සමඟ ඉතා සමීපව කටයුතු කරන පිරිසකි. මෙවර ලෝක පරිසර දිනය යෙදී තිබුනේ ජුනි මස 05 වන දිනටය. මෙවර එහි තේමාව වූයේ "සොබාදහම සඳහා කාලයම යන්නයි" එම තේමාව අර්ථවත් කරමින් රාහුල විද්‍යාලයීය 2020/21 ශිෂ්‍ය නායක මණ්ඩලය විසින් දැවැන්ත ප්‍රති වන වගා ව්‍යාපෘතියක් දියත් කරන ලදී. කිරින්ද මහයාය රක්ෂිතයේ හීල්ලකන්ද ප්‍රදේශයේ විශාල භූමි ප්‍රමාණයක් ආවරණය වන පරිදි පැළ 250 කට අදික සංඛ්‍යාවක් රාහුල ශිෂ්‍ය නායකයින් විසින් රෝපණය කරනු ලැබීය. පරිසර දිනයට සමගාමීව ජුනි මස 18 වන දින මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවූ අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ මාතර අඩවි වන කාර්යාලය සමඟ එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.












# ALLEVIATING POVERTY IN SRI LANKA THROUGH HIGHER EDUCATION

## The education system in Sri Lanka

Sri Lankan education system has been developed and designed in the British colonial period which lasted from 1796 to 1948. The school examinations and subject contents remain modeled on the British examinations of the same names – the GCE O/Levels and A-Levels until today. Children in Sri Lanka start school at the age of 5 and are compulsory to stay until the age of 16.



The Country's education system has undergone a number of reform efforts over the past 70 years. According to the Ministry of Education, Sri Lanka enacted "comprehensive education reforms" in 1947, 1960-61, 1972, 1981, 1997 and 2006. Most of the reforms are summarized below:

- 1947: Introduction of free education from Kindergarten to University
- 1961: Governmental take-over of denominational schools to establish a national system of education
- 1972: Attempt to make secondary education content more applied by adding a mandatory pre-vocational course at the junior secondary level.
- 1981: Reform proposal to decentralize educational administration and create "cluster schools" to pool resource-poor schools with schools with more resources.
- 1985: Establishment of National Institute of Education
- 1986: Establishment of National Colleges of Education
- 1987: Devolution of power to provincial councils
- 1991: Establishment of National Education Commission [for teacher training]
- 1997: Reforms included a "four pronged strategy"
- 1998: Enactment of compulsory education regulations
- 2006: Education Sector Development Framework and Programme (2006-2010)



රාහුලය 2020

## Poverty in Sri Lanka

Alleviating poverty is a difficult and multifaceted challenge to many of the developing countries like Sri Lanka. A number of Poverty Alleviation and Social Welfare Programmes have been introduced by consecutive governments aiming to reduce poverty in Sri Lanka.

Main poverty alleviation programmes implemented so far are 'Rice Ration Scheme', 'Food Stamp Scheme' 'Janasaviya', programme (introduced in 1989) and 'Samurdhi' programme (introduced in 1994).

In addition to these a number of other welfare schemes have been implemented from time to time, specially aimed at reducing malnutrition among school children. Most of the Health and Educational Indicators such as Infant Mortality Rate, Maternal Mortality Rate, Fertility Rate; Birth Rate, Death Rate, Expectation of Life at Birth, Literacy Rate, School Enrolment Rate etc., shows that the people of Sri Lanka have benefited immensely from free education to all, including University education and free medical care, efficient immunization programmes, etc.

However, with all the governmental involvements to decrease poverty, data shows that considerable poverty and under nutrition among children still remains, though there is gradual decrease. With all the welfare programmes that have been implemented during the last few decades by the successive governments, Sri Lanka could have done better. How can we help?

How higher education can help to alleviate poverty as school children, you must understand the poverty level of Sri Lanka. We should also find ways to helping respective authorities to alleviate poverty. First and foremost thing is to protect free education system in Sri Lanka while giving opportunities for more people to engage in higher education. In future Sri Lanka may establish good private education system for giving more opportunities to develop higher education system. Successive governments spend colossal amount of public tax money to maintain the higher education system. Identification of sinister elements who plan to destroy the quality of higher education system will be your responsibility. You should not fall prey to such elements and your free thinking should be sharpened. Our higher education has its biggest failure as it fails to establish free and innovative thinking among stake holders. As students we should be able reap the harvest of free education by not only acquiring necessary skills and knowledge but also by acquiring free thinking ability and correct attitudes.

We must engage in our studies well to develop knowledge skills and attitude. It is also important to take every opportunity to engage in higher education. Obtaining degree with suitable qualifications and skills will ultimately help the country to eliminate poverty. In the future you will be able to develop and modify existing system of education into a much useful program which can be very helpful to the country to alleviate poverty. Poverty alleviation that have been introduced are not working well as productivity and development do not spread equally all over the country. Our country requires graduates or trained people to establish industries and other development programs effectively. Therefore you have a responsibility to take part of the development drive by acquiring higher degree qualifications.

Dr. Saman Ediriweera
Professor
Department of Biosystems Technology
Faculty of Technology
University of Ruhuna
















රාහුලය 2020




රාහුල ශිෂ්‍ය පරම්පරාවට සැමදා දෙවනි මව්වරුන් පියවරුන් පිරිසක් වෙමින් ඔවුන්ව යා යුතු නිවැරදි මාර්ගයේ ගමන් කරවන්නේ රාහුල ඇදුරු මඬුල්ලයි. වසර 13 ක් පුරාවට ගුරු හරුකම් ලබා දෙමින් රාහුලයෙන් වෛද්‍යවරුන්, ඉංජිනේරුවන් ආදී නොයෙකුත් රටට දැයට වැඩදායී පුරවැසියන් බිහිකිරීමෙහිලා ගුරු මව්වරුන් පියවරුන් සිදුකරන්නේ අනුපමේය මෙහෙවරකි හුදෙක් අධ්‍යාපනයම පමණක් නොව ආදරය, කරුණාව, සෙනෙහස, චරිතවර්ණය ආදී සියලුම දේ සිසුන්ට ලබා දෙමින් රාහුලයන් නිසි මගට යොමු කරන විද්‍යාලයීය ගුරු මණ්ඩලය ඇගයීමේ උපහාර උත්සවයක් ලෝක ගුරු දිනයට සමගාමීව ඔක්තෝබර් මස 06 වන දින රාහුල විද්‍යාලයීය 2020/21 ශිෂ්‍ය නායක මණ්ඩලය විසින් සංවිධානය කරන ලදී ඉසිවරාභිෂේක 2020 නමින් වර්ණවත් වූ මෙම උපහාර උළෙලට විද්‍යාලයේ විදුහල්පතිතුමන් ඇතුලු ආචාර්යය මණ්ඩලයේ බොහෝ දෙනෙකු සහභාගී වූ අතර **No Name SL** සංගීත කණ්ඩායමේ සංගීතයෙන් මෙම ගුරු සැඳෑව සංගීතවත් විය. මෙහිදී විද්‍යාලයේ ආචාර්යය මණ්ඩලය සඳහා විද්‍යාලයේ ශිෂ්‍ය නායක මණ්ඩලය විසින් සකස් කරන ලද නව හැඳුනුම්පතක් තිලිණ වශයෙන් ලබා දීමට ශිෂ්‍ය නායකයින් කටයුතු කළ අතර ගුරු මණ්ඩලය සඳහා රාත්‍රී භෝජන සංග්‍රහයක්ද උත්සවය අවසානයේ පිළිගන්වන ලදී.











රාහුලය 2020

# FUTURE PLAN OF RAHULA COLLEGE




























1923 -2023
RAHULA
DIGNITY OF THE CENTURY

# සිනහා කඳුළු එනවා යනවා



කුමන දේ අප ඉගෙන ගත්තත් උතුම් ගුණ ධර්ම තුළින් ඈත් වී ලබන අධ්‍යාපනයේ කිසිදු හරයක් නැති බව අප මතක තබා ගත යුතුය. හැකි සෑම විටම අවංකව වැඩ කරන්න. එවිට වරදින එකක් නැහැ. "සිනහා..... කඳුළු...... එනවා...... යනවා......" මෙය ප්‍රසිද්ධ ගීතයක කොටසකි. එහෙම තමයි මේ පංචස්කන්ධය නොහොත් ජීවිතයෙහි හැටි. කවදාක හෝ ආපසු ජීවිතය දිහා හැරිලා බලපුවාම සතුටු වෙන්න පුළුවන් විදියට අප ජීවත් විය යුතුය. බාධක වලට ජීවිතයේ අරමුණු නැති කරන්න දෙන්න එපා. ජීවිතයෙහි සැබෑ සාර්ථකත්වය වෙනුවෙන් ඒවා අභිබවමින් පියමං කරන්න. ඔබගේ සාර්ථකත්වය ලබා කර ගැනීමට ඔබ කළ යුත්තේ අසාර්ථකත්වයට පත් වුවත් කිරීමට මැළි වූ දෙයය.

ඒ සඳහා ඔබ බොහෝ අත්දැකීම් ලබාගත යුතු අතර, බොහෝ කැප කිරීම් සිදු කිරීමට ඔබට සිදුවනු ඇත. එමෙන්ම එම ගමන ද දුෂ්කර වනු නියතය. නිසල මුහුද කිසිදා දක්ෂ නාවිකයකු බිහි කරන්නේ නැත. නමුත් අප එය තරණය කළ යුතුය. හැම මොහොතකදීම බිම ඇද වැටිය හැකිය. නමුත් දෙපයින් නැවත සිට ගැනීමට සිදු වේ. ඒ සඳහා සිත ශක්තිමත් විය යුතුය.

දක්ෂතාවය යනු එයයි. ජීවිත ගමනේදී මහා කුණාටු, භූමි කම්පා, සුනාමි වලට මුහුණ දීමට සිදු වුවත් ක්ෂේම භූමිය කරා යන ගමන නවතා නොදැමිය යුතුය. තමාගේ සාර්ථකත්වය ලඟා කර ගත යුත්තේ තමන්මය. ඉක්මණින් හෝ පමා වී හෝ දිනන මිනිසා වනුයේ තමාට හැකි යැයි සිතන මිනිසාමය. බට්ති කුරුල්ලාගේ ගී ඇසීමට නම් වසන්තය එනතුරු බලා සිටිය යුතුය. එසේ තම ජීවිතයෙහි ස්වර්ණමය යුගය නොහොත් සාර්ථකත්වය ලඟා කර ගැනීමට ඉවසීමෙන්, ඕනෑකමින්, බලාපොරොත්තු සහිත මනසින් සිටිය යුතුය. දීර්ඝ කාලීන සැපය උදෙසා වත්මන් සුරපුරය සේ පෙනෙන අමුලික වු කුඩා සැපය පසෙකලා යථාර්ථය සමගින් වු සාර්ථකත්වය ලඟා කර ගැනීමට කටයුතු කරන්න. සිනහව, කදුළු අතරින් ඔබේ ඉලක්කය සපුරා ගන්න.

මම,
කේ. ජී. පසිදු දෙනුවන්







## වසංගතයට පැරදවීමට නොහැකි වූ රාහුලයන්ගේ මිනිසත්කම

# සෙනෙහසේ අරුණැල්ල 2020

ගෝලීය කොවිඩ්-19 වෛරසයෙන් මුලු ලොවම පීඩා විඳීමට පටන්ගෙන දැනට පුරා වසර එකහ මාරකට ආසන්න කාලයක් ගෙවී හමාරයි. ශ්‍රී ලංකාව පුරාද වසංගතයේ අඳුරු සෙවනැලි පසුගිය වසර පුරාවට විවිධ අවස්ථාවන් වලදී පැතිරී ගියා. දිවයින පුරා විටින් විට ක්‍රියාත්මක කෙරූ ඇඳිරි නීති තත්ත්වය හේතු කොටගෙන පුරා සති ගනන් මාස ගනන් රට වසා දැමීම හේතුවෙන් අපේම මිනිසුන් පිරිසක් හවු හරණක් නොමැතිව අසරණ වුනා. එසේ අසරණ වූ අපේම මිනිසුන්ට පිහිට වන්නට රාහුලයන් අමතක කලේ නැහැ. සෙනෙහසේ අරුණැල්ල ව්‍යාපෘතිය රාහුල විද්‍යාලයේ 2020/21 ශිෂ්‍ය නායක මණ්ඩලය විසින් ක්‍රියාවට නංවන්නේ මෙවන් පසුබිමකයි. රටෙහි එ වන විට පැවැති තත්ත්වය හමුවේ විශාල වශයෙන් එකරාශි වී මෙම ව්‍යාපෘතිය සංවිධානය කරන්නට ඔවුන්ට නොහැකිවුවත් එකිනෙකට වෙනස් වූ අදියර 05 ක් යටතේ මෙම ව්‍යාපෘතිය සංවිධානය කිරීමට ඔවුන් පියවර ගනු ලැබුවා. එහි පළමු අදියර වශයෙන් ඔවුන් විසින් 2020 අප්‍රේල් 01 වන දින නාදුගල මහ විද්‍යාලයේ ඉගෙනුම ලබන අඩුම් ආදායම්ලාබී සිසුන් 40 කගේ පවුල් වෙත වියළි ආහාර ද්‍රව්‍ය බෙදා දීම සිදුකෙරුනා. සෙනෙහසේ අරුණැල්ල දෙවෙනි අදියර වශයෙන් ඇඳිරි නීති තත්ත්වය හමුවේ කුසට අහරක් නොමැතිව පීඩා විදිමින් සිටි මාතර නගරය අවට දුගී මගී ජනතාවට දිවා අහාරය ලබා දීම රාහුලයන් විසින් සිදු කරනු ලැබුවා. මෙම වැඩසටහනේ තුන්වැනි අදියර ලෙස නැවත් වතාවක් මාතර නගරයේ දුගී මගී ජනතාවට සහ නගරයේ ආයතන වල සේවය කෙරූ ආරක්ෂක අංශ නිලධාරීන්ට මෙන්ම ඇඳිරි නීති රාජකාරී වල නිරත වෙමින් සිටි පොලිස් නිලධාරී මහත්වරුන්ටද දිවා අහාරය ලබා දීමට රාහුල විද්‍යාලයේ ශිෂ්‍ය නායකයින් කටයුතු කරනු ලැබුවා. ඉන් නොනැවතුනු රාහුල ශිෂ්‍ය නායකයින් රාහුල විද්‍යාලයේ ආදි ශිෂ්‍ය නායක සංගමය හා එක්ව මෙම වැඩසටහනේ තවත් අදියර දෙකක් ක්‍රියාවට නංවනු ලැබුවා. සෙනෙහසේ අරුණැල්ල සිව්වන සහ පස්වන අදියරන් ලෙස 2020 අප්‍රේල් මස 15 සහ 16 යන දෙදින දෛනික වැටුප් ලබන අඩු අදායම් ලාභී පවුල් 100 කට අවශ්‍ය කරන වියලි අහාර ද්‍රව්‍ය මලු බෙදාදීම සිදු කරනු ලැබුවා. මෙහිදී රාහුල ප්‍රාථමික අංශයේ ඉගෙනුම ලබන අඩු ආදායම් ලාබී පවුල් වල සිසුන් සහ මාතර වල්ගම ප්‍රදේශයේ දෛනික වැටුප් ලබන පවුල් ඉලක්ක කරගනු ලැබුවා. මහා වසංගත තත්ත්වයක් හමුවේ ලොවම අසරණ වූ මොහොතක අපේම මිනිසුන් වෙනුවෙන් රාහුලයන් සිදු කලා වූ මේ මෙහෙවර මනුෂ්‍යත්වයේ අගය මනාව පිළිඹිබු කරන්නකි.








# සිසු නයු අභිසෙස්

කුරුළු පැටවුන් විලස විදු කැදැල්ලේ හැදුනු
රහල් දරුවනේ නුඹයි - විදු මවගේ ශක්තිය
පෙරබරේ පායන්න දිදුලන්න තරු විලස
නුඹයි හිරු කිරණ රහල් මව සරසන්න

ගුරු මව්පියන් දුන් ඔවින් යහමගට පැමිණියෙමු
දකුණු ලක පෙරබරෙහි ගුරු තරුව සේ සිටිමු
අද ඔබේ දිවි මගෙහි කිරුළු පළඳවමු
මව් බිමට නයුවුවන් විලස සේවය කරමු

ලබා සිප් පන්නරය රහල් සෙවනේ ඉදන්
තබා ගුරු ගෞරවය අපෙන් අභිසෙස් අරන්
තබා පිය මඟ සොයා පහන් වැඹ දල්වමින්
නොබා පෙරටම එන්න රහල් නයුවන් ලෙසින්

රහල් මවගේ එළිය ඔබේ නෙතට පෙනේවා
ඇගෙන් ලද යහගුණය ඔබේ හිතට දැනේවා
ජය සතුට වෙර දිරිය දිවි මගට ගෙනේවා
තුණුරුවන් ගුණ බෙලෙන් ඔබට ජය ලැබේවා

විද්‍යාලයීය ආචාරිණී
නිලානි ප්‍රියදර්ශිකා ජයසූරිය



### සෙනෙහසින් අම්මාට

මහමෙර කුඩයි
ඔබෙ සෙනෙහස වැඩි හින්දා
සමුදුර ටිකයි
ඔබ විඳි දුක් ගොඩ හින්දා
ක්ෂිතිජය ළඟයි
ඔබ ගිය මහ දුර හින්දා
ඉර හඳ කළුයි
ඔබ නැති පාළුව හින්දා

D.S. දම්මිකා ද සිල්වා
විද්‍යාලයීය ආචාරිණී



### ගුරු සිත නොරිදවා

මාපිය දෙසිත් හඬවා කුසට
අහරක් නොමැති කුමරුට
කප්පරක් මහ දැනුම බෙදුවා
ලොකු පොඩි සැමට සමවා සම
සම තැනම හිඳුවා බත් පතත්
දන් දී පුතුනට සම සමාජය
එතැන සැදුවා
එක එකෙකු ගෙන ළඟට කැඳවා
තුරුල් කරගති ළයට බඳවා
දණින් නොවැටී යනෙන ගමනට
මමම පෙරමඟ ලකුණු හැදුවා
ජන්ද උණුසුම ගමට කැඳවා
ඇමති දෙව්වරු බිමම හිඳුවා
ගමේ දිළිඳුන් පෙළන ගමනට
මගේ එකෙකුත් හිඳිනු දුටුවා
පත්‍රිකාවක් මටත් බෙදුවා ස

ලලිත් චන්දන අමරවීර
විද්‍යාලයීය ආචාර්යය

# ගුරු සිසු නිර්මාණ



### වෙනසක්

හා පැංචා ලන්ද උඩින්
දුවගෙන ආවා
ඉබි පුංචා හෙමින් නියර
උඩට ම ආවා
ඉතින් කෝම සැප සනීප
විස්තර ඇසුවා
ආයෙත් දුවමුද තරගෙට
හාවා ඇසුවා
හැමදාමත් ඔට්ටු දුවලා
දැන් හති යාළු
බට්ට පැනලා වච්ච තියලා
නෙළමු ද ඕළු
චග් ගුඩු ගුඩු ගුඩු කියලා
කරලා විහිළු
දාං ඇදලා කැරම් ගහලා
අරිමුද පාළු
එල්ලෙ ගහලා කබඩි කියලා
කරලා සෙල්ලම්
පංච දමලා ඔළිඳ දමලා
කරලා කෙළිකම්
අතුරු මිතුරු දඹදිව තුරු
රසාකර කවිකම්
හොරා පොලිස් සෙල්ලම් කර
ලබමුද විරුකම්

D. S. දම්මිකා ද සිල්වා
විද්‍යාලයීය ආචාරිණී

### පියාණනී

පියාගෙන දෑස්
සිටින විට
සිහිවිය
ඔබෙ අතීතය වසර ගණනක්
පසු පසට ඇවිද ගියමුත්
යළි පැමිණියේ
උණුසුම ඔබේ
නිවී ගිය බව
දැනුණ විට
වීය සසල
මගේ හද

R.M. නදීකා පුෂ්පකුමාරි මිය
විද්‍යාලයීය ආචාරිණී
ගෘහ විද්‍යා අංශය




### මුල

වැටුන මොහොතක
නැගිට ගන්නට
දෑත දුන් අය
මතක නැත්නම්...
ලොවම අහිමිව
තනි වූ මොහොතක
ලගින් උන් අය
අමතකයි නම්..
දියුණු වන විට
අකුල් නොහෙලා
සතුටු වුණ අය
මතක නැත්නම්...
කුමන ජගතෙක්
උනත් පල නෑ
ජීවිතේ මුල
අමතකයි නම්...

පන්සිළු







### ලස්සන ලංකා

නිල්ල වැදුන ගොයම් කරල්
පාවෙන සුළගේ
හෝ හඩ දී දිය වැල් පෙළ
ඇදෙනා වේගේ
උසට උසේ කාඳු ද පෙනේ
යෝධයෝ වාගේ
මුහුදින් හැඩ වෙලා අනේ
සිරිලක මාගේ
මහ ඇතුන්ගේ බල ගජ මුතු
තියෙනවා දළගේ
රන් මිණි කැට දිළිසෙනවා
දුටුවන් නෙතගේ
උතුරත් දකුණත් යා වෙන
මිතුදම අපගේ
සිහලත් දමිළත් එකතුව
ගෙන යමු අනගේ



### මිනිස්සු

මිනිස්සු එක්ක
තරහ උනාම
දැනගන්න පුළුවන්
ඔවුන් ඔබේ
විශ්වාසය රකින තරම
කෙනෙක්ට
පුංචි වෙලාවකට හරි
ද්‍රෝහි උනාම
දැනගන්න පුළුවන්
ඔවුන් ඔබේ
ගරුත්වය රකින තරම
ඔබ ලගින් සිටින
මිනිසුන්ගේ සැබෑ ස්වරූපය
හඳුනාගත හැක්කේ
ඔබට වැරදුන විටකයි

පන්සිළු



### අවසානය

ඔබට ආපසු ගොස් ආරම්භය
වෙනස් කළ නොහැක
නමුත් ඔබට
ඔබ සිටින තැනකින් ආරම්භ කර
අවසානය වෙනස් කල හැක.

පන්සිළු

### අභිමානවත් රහල් සිසුනයුවනි...

අධ්‍යාපනය යනු, ලියන්නට
කියන්නට
ඉගෙනීම පමණක් නොව .....
පාසැලේදී ද කෙළිබිමේදී ද මග
තොටේදී ද
හරි පැවැත්ම පිළිබද ගුණධර්ම
අතින් පුහුණුවත් ලැබීමයි .....

මානව බන්ධුත්වයේ පුෂ්ප
සුගන්ධය
මිහිමත ලියලා වැඩෙන්නට
ඔබ .... කල්ප වෘක්ෂය වන්න
දරුවනි ....

සහස් සුවහස් දෙනා අතුරින්
ඤාන ගුණය පිරි රහල් පැටවුන්
නා්ගන කාහල සිංහ නාදය
දිගන්නරයේ පැතිර යාවි ....

ඉතිං සිසුනයු රහල් දරුවනි,

උදාවන හෙට දිනය ඔබගෙයි
නායකත්වයේ කිරුළ ලැබගෙන
උපන් මව්බිම, සමය සමගින්
දිවි පුදා හෝ රකිනු විරුවනි
සහස් සුවහස් පැතුම් මල් ඔබේ
පිපේවා .... හෙට හිරුද සමගින්
ජයග්‍රහණයේ .... සේද මාවතේ ....

සුභ පැතුම්....
රුවන් වන්නිආරච්චි
විද්‍යාලයීය ආචාර්යය



# ගුරු සිසු නිර්මාණ

ඩීවන්ත ලයාන් ලක්මිණ
11-I






මිනුල සංසිත රණතුංග
8-G



පැහැසර රන්දිල්
9-C

පැහැසර රන්දිල්
9-C





ඉෂාන් සෙනුර
8-C



රාහුලය 2020

හසිදු ලක්ෂිත
11-E



අචින්ත්‍ය සමාදිත්
7-C



නේතන් කුරුකුලසූරිය
6-A





තිවිරු තුල්සර
6-H



හසිරු මානෙත් මුණසිංහ
6-F



## මුදල්

මුදලට පුළුවන් ඇඳක් මිලදී
ගන්න
නමුත් නින්ද මිලට ගත
නොහැක...
මුදලට පුළුවන් ඔරලෝසුවක්
මිලදී ගන්න
නමුත් කාලය මිලට ගත
නොහැක...
මුදලට පුළුවන් පොතක් මිලදී
ගන්න
නමුත් දැනුම මිලට ගත
නොහැක...
මුදලට පුළුවන් මිනිසුන්
ආකර්ෂණය කරගන්න
නමුත් ආදරය මිලට ගත
නොහැක...
මුදලට පුළුවන් ලේ මිලදී ගන්න
නමුත් ජීවිතය මිලට ගත
නොහැක...
මුදලට පුළුවන් ජීවිතය රක්ෂණය
කරන්න
නමුත් මරණය වැළැක්විය
නොහැක..

## ගෘහනිය

මහන්සි මට හොදටම
කරලා උදවු හැමටම
තෙහෙට්ටුයි මට හොදටම
හිතලා අනුන් හිත් ගැන
හිතෙනවා මට දවසෙම
නිදන්නට ඒ හින්දම...
නිදාගෙන මම කොහොමද
ගෙදර වැඩනේ හොදටම
නැතුවාම හොද තියනට
කරන ඒ වැඩ කන්දට
එකක් හෝ ම හැරෙනවා
දෝස උපදෙස් කන්දක
හිතන්නට වත් මගෙ ගැන
මටම සිහියක් නැති කොට
අහනවා උන් කදිමට
මොකද කෙරුවේ දවසෙම...

පන්සිළු



## මේ ටික හිතට ගන්න

විනාශ නොකළ යුතු කාරණා
තුනකි
කාලය-ශක්තිය-මනුස්සකම
පිටු පෑ යුතු කාරණ තුනකි
කම්මැලිකම-චාටාලකම-ඉක්මන්
තීරණ
සුරකිය යුතු කාරණා තුනකි
හොඳ පොත්පත්-යහගුණ-හොඳ
මිතුරෙක්
පාලනය කළ යුතු කාරණා තුනකි
ආසාව-කට-කෝපය
අගය කළ යුතු කාරණා තුනකි
නුවණ-යහගුණ-නිදහස
ආදරය කළ යුතු කාරණා තුනකි
ආදරය-සොබාදහම-සදාචාරය



## හිතේ නිදහස

ගෙවා ආ දුර
හැරී බැලුවම
පසු තැවෙන්නට
දෙයක් නෑ...
ගත්ත තීරණ
වින්ද සැපදුක
සමකරයි අඩු
වැඩිත් නෑ..
හෙටක් වෙනුවෙන
අද මැරීගෙන
තැවී තැවී හිඳ
පලක් නෑ...
හිතේ නිදහස
සෑම සැනසුම
තරම් කිසිවකි
වටින් නෑ...

පන්සිළු





# ගුරු සිසු නිර්මාණ

## නිහඬ බව

නිහඬ බව යනු
ප්‍රබලතම
හඬ වන අතර
නිහඬ වූවෙකු
තුළ නිසැකවම
විශාල වේදනාවක්
හැඟව තිබේ.
ඔවුහු නිහඬවන්නේ
කියන්නට යමක්
නොමැති කමට නොව
කියන්නට බොහෝ දේ
ඇති නිසාත්
වටහාගැනීමට තරම්
සුදුසු මිනිසුන්
ඔහු හෝ ඇය වටා
නොමැති නිසාත්ය.

පසිඳු දෙනුවන්



රාහුලය 2020

## අද යථාර්ථය

ලොකු ගෙයක්
කුඩා යුවලක්
වැඩි උපාධි ගණනක්
අඩු සාමාන්‍යය දැනීමක්
දියුණු කළ බෙහෙත්
දුර්වල සෞඛ්‍යයක්
හද අල්ලයි
අසල් වැසියන් නොහදුනයි
විශාල ආදායමක්
අඩු මානසික සහනයක්
ඉතා බුද්ධිමත්
අඩු සංවේදී තාවක්
හොඳ දැනුමක් ඇත
නුවණ නැත
සබදකම් බොහෝ ඇත
සැබෑ ආදරයක් නැත
ෆේස් බුක් මිතුරන් ඇත
කළණ මිතුරන් නැත
මත් පැන් වැඩි වී ඇත
වතුර අඩු වී ඇත
මිනිසුන් ඇත
මනුස්සකම නැත
වටිනා ඔරලෝසු ඇත
ඒ අත් වෙලාව නැත

මෙනුර බාසිත

## ජීවිත ගමන මගෙ

ඔබ විය නවිය හිතේ
පෙම්බර වෑන් ලයේ
පිටවිය ඔබේ මුවේ
ජීවිත ඔරුව මගේ
ඔබ විය හබල උනේ...
මගේ ලොව බලය උනේ
ඔබේ සිත පියාණනේ...

පන්සිළු



## තාත්තා නම්ණා

පතන්නට පවා මා
වරම් අහිමි වූ
හැඟීමක් රිදුම් දෙ
හෙටට උරුම වූ
දිනන්නට කිසිත් නෑ
ලොවේ මින් මතු
මගෙන් ඔබ ඈත්වී
ගියායින් පසු..
පිරිමැද ගිය ඔබෙ සුරතින්
සිතේ දුක නිවා
අදින් පසු මියේවි
ඔබේ ඒ කථා
රකින්නට කෙසේ හෝ
හඬන්නට එපා කියා
නලවූ ඔබ මා
තාත්තා නම්ණා

පන්සිළු



## බොරුව

බොරුව කරපු කෙනාට
කවදාවත් සැනසීමක් නැත
කොච්චර උජාරුවට කිව්වත්
තමන් හරි කියලා
හෘද සාක්ෂිය ළඟ ඔවුන්
හැමදාමත්
නිරුත්තරව රිදවනවා

පන්සිළු

# සුපසන් රාහුලයක් සඳහා කාර්යක්ෂම "ගුරුභවතෙක්"

අනාගත දරුවා ගොඩනාගන ගුරුවරයා සෞඛ්‍යසම්පන්න කිරීමේ අරමුණ පෙරදැරිව රාහුල විද්‍යාලීය Mother ශ්‍රී ලංකා පාසල් සමාජය හා විද්‍යාලීය සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව එක්ව 2020 දෙසැම්බර් 10 වැනි දින මාතර නූපේ සණස ශාලා පරිශ්‍රයේදි මෙම 'සුපසන් රාහුලයක් සාදහා කාර්යක්ෂම ගුරුභවතෙක් ව්‍යාපෘතිය පැවැත්විණි.



රාහුල විද්‍යාලීය ගුරුභවතුන්ගේ සහාභාගිත්වයෙන් පැවති මෙම අවස්ථාවෙහි ප්‍රධානතම මාතෘකාව ලෙස භාජනය වූයේ 'නිවැරදි සිත-කය පෝෂණය තුළින් නිරෝගි, ප්‍රඥාවන්ත දරු පරපුරක් රටට දායාද කරමු යන්නයි.

මෙහි ආරාධිත දේශකවරුන් ලෙස කොළඹ රාජකීය විද්‍යාලීය හිටපු විදුහල්පති උපාලි ගුණසේකර මැතිතුමා, වෛද්‍ය මාලින් බටගොඩ මහතා (MBBS, DFM – දිස්ත්‍රික් මහා රෝහල-මාතර), වෛද්‍ය සුජීවා වික්‍රමසිංහ මහත්මිය (MBBS – MSC in Human Nutrition – පෝෂකාරවේදි වෛද්‍ය දිස්ත්‍රික් මහා රෝහල-ගම්පහ), වෛද්‍ය කුමුදු දහනායක මහතා (අධිකරණ වෛද්‍ය විශාරද, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යංශය) හා වෛද්‍ය උත්පලා පෙරේරා මෙනෙවිය (ආයුර්වේදි වෛද්‍ය - බණ්ඩාරනායක අනුස්මරණ වෛද්‍ය පර්යේෂණ ආයතනය) යන විද්වත්හු සහාභාගි වූහ.



හරබර දේශනමාලාවක් ක්‍රියාත්මක වූ මෙම අවස්ථාව පැමිණි සියලුදෙනාගේ පැසසුමට ලක්වූ අතර මෙම විද්වත් අවස්ථාවට සම්පත් දායකත්වය හෙළ සුවය හා සෘෂි නැණ සංගමය විසින් දක්වන ලදි.








# ස්වර්ණ සිංහ සටනට එසැවුණු ප්‍රථම ධජය

රාහුල විද්‍යාලය සහ පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය අතර පැවැත්වෙන මහා ක්‍රිකට් තරඟාවලිය විද්‍යාල දෙකෙහිම සිසුන්ට ගුරුවරුන්ට මෙන්ම ආදි ශිෂ්‍යයින් ඇතුලු අනෙකුත් පාසල් ප්‍රජාවටද ඉතාමත් විනෝදජනක, උද්‍යෝගීමත් කාල සීමාවක්. තම විද්‍යාලයේ ජයග්‍රහණය උදෙසා දෙපාර්ශවයේම පිරිස් නිරන්තරයෙන් කැපවන ආකාරය මේ කාල සීමාවේ දකින්නට පුලුවන් සුලබ දසුනක්. ඒ අතරින් විද්‍යාලයේ ශිෂ්‍ය නායක මණ්ඩලය තම විද්‍යාලයේ ජයග්‍රහණය වෙනුවෙන් සුවිශේෂී මෙන්ම සුවිසල් කාර්යයභාරයක් ඉටු කරන පිරිසක්. සාම්ප්‍රදායිකව විද්‍යාලයීය ධජයන් මාතර නගරය පුරා ප්‍රදර්ශනය කිරීම මෙම ක්‍රිකට් තරඟාවලියට සමගාමීව ඔවුන් විසින් සිදු කරනු ලබයි. මෙවර එම ව්‍යාපෘතිය ආරම්භ කිරීම තරමක් වෙනස් මුහුණුවරකින් සිදු කිරීමට විද්‍යාලයීය 2020/21 ශිෂ්‍ය නායක මණ්ඩලය කටයුතු කලා. ධජ එසවීමේ ආරම්භය සනිටුහන් කරමින් ප්‍රථම ධජය එසවීමේ උත්සවයක් (First flag hoisting ceremony) මෙවර සංවිධානය කිරීමට ඔවුන් කටයුතු කලා. විද්‍යාලයේ සියලුම සිසුන්ගේ සහභාගීත්වයෙන් පාසලේ උදෑසන රැස්වීමක දී විද්‍යාලයේ ඉදිවෙමින් පවතින ගුණතිලක අනුස්මරණ ප්‍රධාන ශාලාවේ ඔසවා තිබූ පළමු විද්‍යාලයීය ධජය,විද්‍යාලයීය විදුහල්පතුමන්ගේ සහ එවකට ප්‍රධාන ශිෂ්‍ය නායක හවිඳු මාරසිංහ සිසුවාගේ අතින් සියලු සිසුන්ගේ අත් පොලොසන් නාදය සහ තූර්ය වාදන කණ්ඩායමේ තූර්යය වාදනය මධ්‍යයේ නිරාවරණය කරනු ලැබුවා. ක්‍රිකට් තරඟාවලියට සමගාමීව රාහුල විද්‍යාලය තුළ ප්‍රථම වතාවට සංවිධානය කරනු ලැබූ මෙම උත්සවය ඉතාමත් අභිමානවත් මෙන්ම සියලුම රාහුලයන්ට තම පාසල කෙරෙහි ඇති අභිමානය තව තවත් වැඩි කරන අවස්ථාවක් බවට පත් වුනා.









Everything can be taken from a man but one thing: the last of the human freedoms—to choose one's attitude in any given set of circumstances, to choose one's own way.

**Viktor E. Frankl**





# ජීවිතයට වගකියන්න

තමන් ගෙවන ජීවිතේ ඇතුලේ සෑම විනාඩියකදීම, සෑම තත්පරයකදීම සෑම නිමේෂයකදීම ජීවිතයට අලුත් අත්දැකීම් එකතු වෙනවා. තමාට මුහුණ දීමට සිදුවන සිදුවීම් සමඟ ඔබ වෙලාවකට වැටෙනවා. ආයේ නැගිටිනවා. පුරුදු චාරිකාව දිගේ පියමං කරනවා. ජීවිතයට එන්නා වූ නානප්‍රකාර අත්දැකීම් ඔස්සේ එවා දරාගෙන ඔබේ සිහිනය සොයා යන්න පුළුවන් නම් අවසානයේ ඔබයි ජයග්‍රාහකයා වනුයේ. දෙවන ලෝක යුද්ධය ක්‍රියාත්මක වන කාලයේදී හිට්ලර්ගේ එක්තරා නාසි යුධ කඳවුරක සිරකරුවන් අමානුෂික වද හිංසා පමුණවමින් ඝාතනය කරනු ලබනවා. මිනිස් ජීවිත තොග පිටින් අමු අමුවේ පුච්චා දමනවා. වදකාගාර කඳවුර පුරා පැතිර යන මරණ  භීතිකාව අස්සේ එකම එක මනුස්සයෙක් ඉන්නවා. තමන්ගේ හිත අභ්‍යන්තරයේ නිදහස, සතුට හා අධිෂ්ඨානය තියාගෙන. මරණය ර්ළඟ නිමේෂයේදී විය හැකිය. ඉරණම එය ලබා දිය හැකියි. එහෙත් මට මොනවද කරන්න ඇහැකි ඔහු හිතන්න පටන්ගන්නවා. ජීවිතය තමන්ට ර්ළඟ මොහොතේදී ඕනෑම අත්දැකීමක් දිය හැකි බව දැනගෙන ඔහු තමන්ගේ ජීවිතයට අරමුණක් ගන්නවා. මරණයට කැපවී ඇති තම ජීවිතයට අර්ථයක් දෙන්න පටන් ගන්නවා. ඔහුගේ සුභවාදී මතය ඔහුට මාවතක් පෙන්වනවා. විවිධ උත්සාහයක් උපක්‍රමයක් යොදා ලෝකයේ තිබූ දරුණුතම හිරගෙදරින් පැනගන්න ඔහු සමත් වෙනවා. අවසානයේ තමා හිරගෙදර ගෙවූ ධෛර්යවන්ත කටුක  කථාව ඔහු මුළු ලෝකයටම ඇසෙන්න කියනවා. ඔහු ලියනවා පොතක් **"MansZs search for meaning"** කියලා. ඔහු නමින් ඕස්ට්‍රියානු ජාතික මනෝ විශ්ලේෂඥ වික්ටර් ෆ්‍රැන්ක්ලර් **(Victor Frankl)** ජීවිතය තුළ මනුස්සයෙක් ඇසිය යුතු වටිනම වැකියක් තම ජීවිතය අනුසාරයෙන් තියනවා. ඔහු කියනවා *සියල්ල මනුස්සයකුගේ උදුරාගත හැකියි. නමුත් එක දෙයක් ඇරෙන්න. එක තමයි, තමන් කැමති විදියට නිදහස් තීරණයක් ගැනීමේ ආකල්පයම යි. ජීවිතයට අරමුණක්, සිහිනයක් ඇති මනුස්සයකුට සාර්ථකත්වයට පෙනෙනවා. ඒ සිහිනයට යන චාරිකාව ඇතුළේ මිනිස්සුන්ට අමාරු. ඒ වගේම අපහසු කාලයක් අත්දැකීම් ලබා දෙනවා. ජීවිතයේදී කුමන සිද්ධියකට ඔබට මුහුණු දීමට සිදුවුවත් වැදගත්ම දේ වනුයේ තමන්ගේ ජීවිතය නර්මාණය කර ගැනීමේ, තමාගේ සිහිනයට ලඟා වීමේ ඒ ආකල්පය කිසිවෙකුට ඔබෙන් උදුරාගැනීමට නොදීමයි. ඔබේ සිහිනය යථාර්ථයක් කර ගත යුත්තේ ඔබමය.*

ජීවිතයේ ඔබට සිදුවන සිදුවීම් පාලනය කළ නොහැක. නමුත් වැදගත්ම දේ වනුයේ ඔබ එයට දක්වන ප්‍රතිචාරයි. පාලනය කළ හැකියි. සරල වචනයක් තියෙනවා **"Responsibility"** කියලා. **"Response ability"** ප්‍රතිචාර දැක්වීමේ හැකියාව නැතිනම් වගකීම් සහගත බව.ඔබේ ජීවිතයේදීඔබට සිදුවන ඕනම දේකදී ප්‍රතිචාර දැක්වීමේ හැකියාව නැත්නම් **"Response ability"** එක ඔබට තියෙනවා නම් ඔබේ දිනන දිශාවේ ඔබට ඉන්න පුළුවන්. ජීවිතය තුළ දහසක් වූ ප්‍රශ්න ඇති. මානසිකත්වය බින්දුවටම වැටිලා ඇති. ඔබට තෝරා ගැනීමක් තියෙනවා. එක්කො මානසික පිස්සෙක් ලෙස අරක්කු, සිගරට්, බියර් බෝතලයට අත තියන්න පුළුවන්. නැත්නම් තමන්ගේ ජීවිතය අලුතින් නිර්මාණය කරගන්න පුළුවන්. ඔබට ලැබුණු ජීවිතය ජයග්‍රහණය කරවීම 100% ඔබගේම වගකීමක්. ඔබ ඔබෙන්ම අහන්න. ඇයි ඔබ ජීවත්වෙන්නේ කියල. ලෝකය තුළ මොනවද ඔබට කරන්න අවශ්‍ය කියල. ම පැහැදිලිව ඔබේ සිහිනයෙහි දිශාව දකින්න පුරුදු වෙන්න. බාහිර පුද්ගලයින් සිද්ධීන් ඔබේ කකුලෙන් අදීවි. සෑම විට ඔබ, ඔබම වන්න. ඉඩෝරය සැමදා පවතින්නේ නැත. මල් පිපුණු වසන්තය කෙදිනකයේ අනිවාර්යයෙන් පැමිණෙනු ඇත. එතෙක් ඉවසා දරා කටයුතු කිරීම ඔබගේ වගකීමකි. ජීවිතය රංග වේදිකාවක් නම් ඔබ මා එහි තාවකාලික නළු නිළියන් වන්නෙමු. තමාට ලැබෙන භූමිකාව නිසිලෙස රඟ දක්වා අර්ථාන්විත බවක් එයට එක් කොට නික්මයාම ලොවට වැඩදායී වන්නේය.



# රාහුලයෙන් බිහිවූ ප්‍රථම ජනාධිපති පරිසර නියමුවන්

වර්ෂ 1981 දී මධ්‍යයම පරිසර අධිකාරිය පිහිටුවීමේ කර්තව්‍යත් සමඟම එම අධිකාරිය විසින් පරිසරයට ආදරය කරන්න වූ නව අනාගත පරපුරක් බිහි කිරීමේ අභිලාශය ඇතුව වර්ශ 1984දී 'පරිසර නියමු' වැඩසටහන් ක්‍රියාවලිය ආරම්භ කරනු කරනු ලබනවා. එකී ප්‍රතිඵලයක් වශයෙන් මාතර රාහුල විද්‍යාලය තුළත් මෙම පරිසර නියමු වැඩසටහන් ක්‍රියාවලිය ආරම්භ වන්නේ පරිසරයට ආදරය කරන්නා වූ අන්නගත රාහුලයන් පිරිසක් රටට දායාද කිරීමේ අභිමනෙනි.



පරිසර නියමු පදක්කම් ක්‍රියාවලිය පදක්කම් 5කින් සමන්විත වන ක්‍රියාවලියකි. පරිසර නියමු පදක්කම් ලාභියෙක්, හරිත වර්ණ පදක්කම් ලාභියෙක්, රජත වර්ණ පදක්කම් ලාබියෙක්, ස්වර්ණ වර්ණ පදක්කම් ලාභියෙක් මෙන්ම අවසානයේ ජනාධිපති පදක්කම් ලාභී පරිසර නියමුවෙක් දක්වා මෙම ක්‍රියාවලිය දිවයයි.



පරිසර නියමුවෙකු ලෙස,
දේශන වැඩමුළු වලට සහභාගී වීම, ශාක රෝපනය කර නඩත්තු කිරීම, පරිසර කටයුතු පිළිබඳ වාර්තා සැකසීම, පරිසර පිළිබඳ කෙටි නිරීක්ශන වාර්තා සැකසීම වැනි ක්‍රියාකාරකම් සම්පූර්ණ කල යුතු වේ. එමෙන්ම හරිත, රජත වර්ණ පදක්කම් සඳහා ද ස්වර්ණ වර්ණ පදක්කම සඳහාද මෙවැනිම වූ ක්‍රියාකාරකම් රාශියක් සිදුකිරීමට පරිසර නියමුවාට සිදුවේ. අවසානයේ තම පරිසර නියමු ජීවිතය තුල ලබාගත හැකි ඉහළම පදක්කම වන ජනාධිපති පරිසර නියමු පදක්කම වෙනුවෙන් තම උපරිම කැපකිරීම ලබා දෙන පරිසර නියමුවා තමා විසින්ම ඉදිරිපත් කරන ලද පාරිසරික පර්යේශන වාර්තාවක් නිර්මාණය කල යුතුය. එමෙන් ම පාරිසරික සංරක්ශන කටයුතු වලට ක්‍රියාකාරීව සහභාගී වීම, පරිසරයට අදාල රාජ්‍ය ආයතන සමඟ සම්බන්ද වී කටයුතු කිරීම වැනි ක්‍රියාකාරක්ම් වල නිරත් විය යුතු අතරම තවත් වැදගත් ක්‍රියාකාරකමක් ලෙස පාරිසරික ව්‍යාපෘතියක හිමිකමක්ද තමා සතු විය යුතුය. මෙම කර්තව්‍යන් සාර්ථකව නිම කරන පරිසර නියමුවා තම පරිසර නියමු ජීවිතයෙ ඉහලම පදක්කම වන ජනාධිපති පරිසර සම්මනයට සුදුසුකම් ලබයි.





රාහුලය 2020



වර්ථමානය වන විට අප විද්‍යාලය පරිසර නියමු, හරිත වර්ණ, රජත වර්ණ, ස්වර්ණ වර්ණ පදක්කම් ලාභීන් රාශියක් බිහි කිරීමට සමත් වී තිබීම අභිමානයට කරුණක් වන අතරම 96 වසරක පාසල් ඉතිහාසය තුල රාහුල විද්‍යාලය තුලින් බිහි වූ ප්‍රථම ජනාධිපති පරිසර නියමු කණ්ඩායම ද බිහි කිරීමට 2019 වර්ශයේදී,

අනුසර ජයතුංග
සනුර අමරසිංහ
පවන් ටනූෂ ඇපා

යන අපට හැකිවීම එම අභිමානය තව තවත් බැබලවීමට හේතු කාරණා විය. ඒ සඳහා අපට මහඟු සහයක් වූයේ පරිසර නියමු භාර ආචාරිණී ප්‍රියංකා මනම්පේරි ගුරු මෑණියන්ය. වර්ෂ 2013 දි පරිසර නියමුවෙකු ලෙස 6 වෙනි ශ්‍රේණියේදී පරිසර නියමු කණ්ඩායමට ඇතුලත් වන අපි 2014 වර්ශයේදී හරිත වර්ණ පදක්කම් ලාභියෙක් ලෙසත් 2015 වර්ශයේදී රජත වර්ණ පදක්කම් ලාභියෙක් ලෙසත් 2017 වර්ශයේදී ස්වර්ණ වර්ණ පදක්කම් ලාභියෙක් ලෙසත් තම පාරිසරික වගකීම් හා කාර්යයන් ඉටු කරමින් ඉදිරියට පැමිණෙන අපි ජනාධිපති පදක්කම් ලාභියෙකු ලෙස ඉටු කල යුතු සියලු කර්තව්‍යන් ඉටු කරමින් වර්ශ 2019 දී ජනාධිපති පරිසර නියමුවෙකු බවට පත්වන්නෙ රාහුල ඉතිහාසයේ බිහි වූ ප්‍රථම ජානාධිපති පරිසර නියමු කණ්ඩායමද බවට පත් වෙමිනි.

මෙලෙසම තවත් වූ පරිසර නියමුවන් ජනාධිපති පදක්කම් ලාභීන් ලෙස මෙම රහල් මාතාව තුලින් බිහිවනු දැකීම අපගේද අභිලාශය වන අතර තව තවත් වූ පදක්කම් ලාභීන් රහල් මාතාව තුලින් බිහි වේවායි අපි ද ප්‍රාර්ථනා කරන්නෙමු.

*අපි 2019 ජනාධිපති පරිසර නියමු කණ්ඩායම*



# රාහුලය 2020

RAHULAYA

1923 -2023
RAHULA
DIGNITY OF THE CENTURY



## ස්තූතියි...

අභිමානවත් සියවසක අභිමුව සිටිනා රහල් මාතාවගේ 98 වන ජන්ම දිනයට තිලිණ කරන්නට ලැබුනු මෙම *"රාහුලය 2020"* රාහුල විද්‍යාලයීය වාර්ෂික සඟරාව සාර්ථක කරගැනීමට අප වෙත අත දුන් සියලු දෙනා ස්තුති පූර්වකව සිහිපත් කරන්නෙමු.

ඒ අනුව විද්‍යාලයේ වත්මන් විදුහල්පතිතුමන්ටත්, නියෝජ්‍ය විදුහල්පති තුමන්ලා සහ තුමියන්ලාටත්, ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමියටත්, රාහුල විද්‍යාලයේ ශිෂ්‍ය නායක මණ්ඩලය භාර ගුරු මහත් වරුන්ටත්, ව්‍යාපෘතිය සඳහා දායක වූ ආචාර්යය මණ්ඩලයේ ගුරු මහත්ම මහත්මීන්ටත් අප කල ඉල්ලීමට අනුව අප වෙත ලිපි ලබා දුන් සියලුම රාහුල ප්‍රජාවටත්, මෙම ව්‍යාපෘතිය සඳහා සිය නොමසුරු පූර්ණ දායකත්වය සැපයූ විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයටත්, මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට නන් අයුරින් දායකත්වය දුන් සියලු දෙනා ඇතුලු මෙම සඟරාවේ පාඨක ඔබ සියලු දෙනාටත් අපගේ හදපිරි ස්තුතිය පුද කර සිටින්නෙමු.

RANDHEERA AMARASINGHE
GRAPHICS

Download
www.rahulacollege.lk